## 2013 – 06 – 04 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය :-**

| | | |
|---|---|---|
| **01.** | **එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා** | ගරු සභාපති |
| 02. | **කමල් වැල්ලගේ මහතා** | ගරු උප සභාපති |
| **03.** | **ඒ. පී. ලක්ෂ්මී හේමන්තා සිල්වා මෙනවිය** | ගරු නගර සභා මන්ත්‍රී |
| **04.** | **එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **05.** | **එච්. එල්. අනුර කිත්සිරි මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| 06. | **පී. සරත් ශ්‍රීලාල් මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **07.** | **ග්‍රේෂන් කෙරමිණියගේ මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **08.** | **ඒ. ඩබ්. ජගත් කුමාර මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **09.** | **ජේ. ඩබ්. ජයන්ත මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **10.** | **ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **11.** | **කේ. එම්. චන්ද්‍රසිරි මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |
| **12.** | **බී. ජනිත් වික්‍රමතිලක මහතා** | ගරු නගර සභා මන්ත්‍රී |

**ගරු සභාපතිතුමා පළාත් පාලන අමාත්‍යාංශයෙන් පැමිණ සිටි නිලධාරීන් සමග සාකච්ඡාවක නිරතවීම නිසා ගරු උප සභාපති කමල්වැල්ලගේ මහතා මූලාසනයේ අසුන් ගන්නා ලදී.**

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ. ව. 10.00 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.** ☸

## (01)

### 01:01 2013 – 05 – 07 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

2013 – 05 – 07 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව පිලිගත යුතු බවට ගරු සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2013 - 05 – 07 දින පවත්වන ලද මාසික සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**<u>සංශෝධන 01</u>**

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන</u>**

2013- 05- 07 දින සභා වාර්තාවේ 04 වන පිටුවේ " ගාලු පාර පුළුල් කිරීම තුල අපේ නගරයේ ජනතාවගේ වැයවන පෙට්‍රල් ටික හරි ඉතුරු වෙනවා. මේ කිලෝ මීටර් එක හමාර දෙක පසු කරන්න විනාඩි 20 ක් 30 ක් ගත් වෙනවා. ඒ ඉතිරි වන මිනිස් පැය ප්‍රමාණය දස දහසකට වැඩියි. එක පුද්ගලයෙකුගේ විනාඩි 10 ක 15 ක වියදම අම්බලන්ගොඩට දෛනිකව පිවිසෙන 20000 ක වගේ අවම වශයෙන් පිවිසෙන ළමුන් ප්‍රමාණයක් වෙනවා. රට අමතරව ව්‍යාපාරික කටයුතු රජයේ කාර්යාල සඳහා කොළඹ රට බලා යන අපේ සහෝදරවරු ඇතුලු සියල්ලම අද වන විට 100000 ක් විතර වෙනවා. විනාඩිය ගානෙ බැලුවොත් විනාඩි ලක්ෂයක් හානි වෙන ප්‍රමාණය. විනාඩි 20 ක තදබදයක් වුනොත් ලක්ෂ විස්සක් වෙනවා. අපට නොදැනුවත්වම අපේ කාලය කා දැම්මක්. මේ රට ඉස්සරහට යන වෙලාවෙදි අපි ඒ ආකාරයෙන් සූක්ෂමව ඒ දේවල් ගැන අපේ අවධානය යොමු කරන්න ඕනෙ. " යන මව්සින් කරන ලද ප්‍රකාශ සඳහන් විය යුතුයි.

**<u>සංශෝධන 02</u>**

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන</u>**

2013- 05- 07 දින සභා වාර්තාවේ 24 වන පිටුවේ " අපේ කොට්ඨාශය තුල අපේ ප්‍රජාව ඉන්නව ස්වයංරැකියාලාභින්. අනික් මන්ත්‍රීවරුන්ගෙ ප්‍රදේශ වල ඉන්නව ඔප්පු ලබා දිය යුතු ජනතාව. ඒ අයට ඔප්පු ලබා දෙනව වගේම අපේ යටතේ ජනතාවට ස්වයංරැකියා අවස්ථාවක් ලබා දෙන්න. එක එක අයගෙ විවිධ අවශ්‍යතා තියෙන්නෙ. " යන මව්සින් කරන ලද ප්‍රකාශ සඳහන් විය යුතුයි.

**<u>සංශෝධන 03</u>**

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන</u>**

2013- 05- 07 දින සභා වාර්තාවේ 42 වන පිටුවේ " අපිව ගෙන්වන්නෙ දේශපාලනික වශයෙන්නම් අපිව නිසි තැන ස්ථානගත කරන්න ඕනෙ. මන්ත්‍රීවරයා විදියට ලැබිය යුතු තැන ලැබිය යුතුයි. මෙහිදී අපි යම් අපහසුතාවයට පත් වෙනවා. විශේෂයෙන් ගරු ජනාධිපතිතුමා , ප්‍රධාන අමාත්‍යතුමා, ප්‍රදේශයේ නගරාධිපතිතුමා වේදිකාවෙ ඉන්නකොට අපි මන්ත්‍රීවරු හැටියට රට පසෙකින් ඉන්නව නම් ජනාධිපතිතුමා වුනත් කැමතියි. විද්‍යාලයේ සියවස උත්සවයේදි ප්‍රධාන අමාත්‍යතුමා දන්වල තිබුණ මේ මේ අය ගෙන්නන්න කියලා. මගේ අදහස තිබුනෙ ආරාධනා ඇතිව හෝ නැතිව රටේ නායකතුමා ඉන්න තැනකදි ආරාධනාවක් කිරීමකින් තොරව හෝ අපි යනවයි කියන තත්වයක්. ඒ අපේ තියෙන දේශපාලන හැගීම සහ ගරු ජනාධිපතිතුමාට තියෙන ඇල්ම උඩ. " යන මව්සින් කරන ලද ප්‍රකාශ සඳහන් විය යුතුයි.

**(02)** සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන — නැත

**(03)** ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**3:1** “ භාවිතයෙන් ඉවත්කර ඇති යකඩපුටු ලබාදීම ” මැයෙන් 2013-05-16 දාතමින් දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාවේ 2012 භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද යකඩ පුටු 300 ක් ගා/ පී ද ඇස් කුලරත්න විද්‍යාලයේ දරුවන්ගේ ප්‍රයෝජනය පිණිස නගර සභා ආඥා පනතේ 159(1)( උ)) වගන්තිය යටතේ ලබා දීමට දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව දන්වා තිබුණි

තීරණය

☞ **භාවිතයෙන් ඉවත් කර ඇති යකඩ පුටු 300 ක් ගා/ පී ද එස් කුලරත්න විද්‍යාලයට ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**3:2** “ 2013 වෙසක් උත්සවය ” මැයෙන් 2013- 05- 10 දාතමින් වෙළඳ හා කර්මාන්ත මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කිරීම.

වෙළඳ හා කර්මාන්ත මණ්ඩලය මගින් තෙවන වරට ඉදිරිපත් කරනු ලබන වෙසක් තොරණ නගර සභාවට අයත් මහජන ක්‍රීඩා පිටියේ ඇල්පිටිය පාර අසල කොටසේ ඉදිකිරීමට සැලසුම් කර ඇති බවත් ඒ සඳහා අවසර ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

☞ **වෙළඳ හා කර්මාන්ත මණ්ඩලය මගින් තෙවන වරට ඉදිරිපත් කරනු ලබන වෙසක් තොරණ සඳහා නගර සභාවට අයත් මහජන ක්‍රීඩා පිටියේ ඇල්පිටිය පාර අසල කොටස ලබා දීමට සභා අනුමැතියට යටත්ව අවසර ලබා දීඹ වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

**3:3** “ දම් අමා වෙසක් කලාපය 2013 ” මැයෙන් 2013- 05- 10 දාතමින් අම්බලන්ගොඩ, සිරි නිකේතාරාම මහා විහායේ විහාරාධිපති හිමියන් විසින් එවන ලද ලිපිය සභාගත කිරීම.

වෙසක් කලාපයේ උත්සව අවස්ථාවල පාවිච්චි කිරීම සඳහා ප්ලාස්ටික් පුටු 200 ක් ජාතික කොඩි 05 ක් සහ බෞද්ධ කොඩි 05 ක් ද කොඩි කණු 10 ක් ද නොමිලේ ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

☞ **ප්ලාස්ටික් පුටු 200 ක් ජාතික කොඩි 05 ක් සහ බෞද්ධ කොඩි 05 ක් ද කොඩි කණු 10 ක් ද නොමිලේ ලබා දීමට සභා අනුමැතියට යටත්ව අවසර ලබා දීඹ වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

3:4 “ නිවෙස්වලට පිවිසෙන මාර්ගයේ කොන්ක්‍රීට් අතුරා ගැනීම ” මැයෙන් අම්බලන්ගොඩ, පොල්වත්ත, විහාරගොඩ එච්. ඩබ්. පී. ගුණවර්ධන හා ඩබ්. පී. රංජනී යන අය විසින් එවා තිබූ ලිපිය සභාගත කිරීම.

අම්බලන්ගොඩ, පොල්වත්ත, විහාරගොඩ එච්. ඩබ්. පී. ගුණවර්ධන හා ඩබ්. පී. රංජනී යන අපගේ නිවෙස් වලට යාමට ඇති මාර්ගයෙහි වැසි දිනවල යාමට අපහසු බවත් මෙම මාර්ගය නගර සභාවට පවරාගෙන කොන්ක්‍රීට් අතුරා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

☞ **අම්බලන්ගොඩ, පොල්වත්ත, විහාරගොඩ එච්. ඩබ්. පී. ගුණවර්ධන හා ඩබ්. පී. රංජනී යන අයගේ නිවෙස් වලට යාමට ඇති මාර්ගය නගර සභාවට පවරාගෙන සංවර්ධනය කිරීමට සභාව තීරණය කරන ලදී.**

**පෙ. ව. 10.15 ට පමණ ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා මූලාසනයේ අසුන් ගන්නා ලදී.**

## (04) යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ

**නැත**

## (05) යථා පරිදි කල්දී ඇති යෝජනා

**5:1 ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා** **නැත**

**5:2 නිලධාරීන් විසින් ඉදිරිපත් කරන පරිපාලන යෝජනා**

**5:2:1** සභාපතිතුමා/ උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීවරුන් සඳහා ගමන් වියදම් ගෙවීම සම්බන්ධයෙන් 2013-04-22 අංක 1807/2 දරණ ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පනවා ඇති ගැසට් නිවේදනය අනුව කටයුතු කිරීමට සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

## (06) කාරක සහා වාර්තා සලකා බැලීම

**6: 1** **2013- 05- 10** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ජ්. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**අම්බලන්ගොඩ නගර සභාව**

**කළමනාකරණ කමිටු වාර්තාව**

| | | |
|---|---|---|
| **දිනය** | : | **2013/05/10** |
| **ස්ථානය** | : | **නගර සභාව, අම්බලන්ගොඩ** |
| **වේලාව** | : | **පෙ.ව. 10.30** |

**සහභාගීත්වය** :

| | |
|---|---|
| **ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප්** | - **සභාපති** |
| **ඩී. වී. සුනිල් මයා** | - **ලේකම්** |
| **ඩී. ඩබ්. පත්මසිරි මයා** | - **ගණකාධිකාරී** |
| **එම්. ඩබ්. සිසිර කුමාර මයා** | - **කර්මාන්ත අධිකාරී** |
| **එච්. එච්. ජයසේන මයා** | - **මහජන සෞඛ්‍ය පරීක්ෂක** |
| **ශාන්ති ඩී. රාමනායක මිය** | - **ප්‍රධාන කළමනාකරණ සහකාර** |
| **එස්. නිර්මලා ද සිල්වා මිය** | - **ප්‍රධාන ආදායම් කළමනාකරණ සහකාර** |
| **කේ. සී. සී. ප්‍රනාන්දු මිය** | - **අභ්‍යන්තර විගණන නිලධාරී** |
| **මංජරී ත්‍යාගා සමරසේකර මිය** | - **සංවර්ධන සහකාර** |

➢ 01. පිළිගැනීම. - **ලේකම්**

➢

❖ ඉතාමත් කෙටි කාලයක් තුල දී කාර්ය සාධන තරග දෙකක් සඳහා මුහුණදීමට සිදු වූ බවත් ඒ සඳහා - **ලේකම්** අංශ ප්‍රධානීන් ඇතුළු සියලු නිලධාරීන් උපරිම වශයෙන් දායකත්වය ලබා දුන් බවත් ඒ වෙනුවෙන් දායකත්වය දැක් වූවන්ට ප්‍රශංසා ලිපි පෞද්ගලික ලිපිගොනුවලට ඇතුලත් කළ යුතු බවත් කාර්ය සාධන මෙවලමට අනුකූලව 2013 වර්ෂයේ දී ද ක්‍රියා කළ යුතු බවත් ඒ සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ලබා දිය යුතු බවත් ඉදිරි සාකච්ජා වූව සකස් විය යුත්තේ ක්‍රියාකාරී සැලැස්ම මත බවත් කාර්යසාධන කටයුතු වෙනුවෙන් දායකත්වය ලබා දුන් අංශ ප්‍රධානීන් ටත්, නිලධාරීන්ටත් ස්තුතිවන්ත වන බවත් පවසා සිටින ලදී.

**පරිපාලන අංශය පිළිබඳව සාකච්ජා කිරීම**

❖ පුද්ගලික ලිපිගොනු විෂය නව නිලධාරියෙකුට භාර දුන් බවත් මේ වන විට යාවත්කාලීන කර ගෙන යන - **ප්‍රධාන කළ: සහකාර** බවත් නව නිවාඩු විෂය නිලධාරී විසින් නිවාඩු යාවත්කාලීනව කර ගෙන යන බවත් නිලධාරී පුහුණු සැලැස්ම සකස් කර ගෙන යන බවත් පවසා සිටින ලදී.

❖ කාර්ය සාධන මෙවලමට අනුව එක් එක් නිලධාරියාට අයත් වන විෂයයන් පිළිබඳව කාර්ය සාධන වාර්තා - **ගරු සභාපති** වක් සකස් කරන ලෙසත් එහි එක් එක් නිලධාරියා විසින් තම විෂයයන්ට අදාළව ලබා ගත් ලකුණු මට්ටම යොදන ලෙසත් එය පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කරන ලෙසත් එය වාර්ෂික කාර්ය සාධන ඇගයීමේ දී සළකා බලන ලෙසත් පවසා සිටින ලදී .

- පිළිගැනීමේ නිලධාරී ලෙස ඉෂා ක්‍රිෂාන්ති මිය පත් කර ඇති බවත් එම මහත්මියට සභා කටයුතු හා පිළි - **ලේකම්**
  ගැනීමේ නිලධාරී යන කටයුතු දෙකම කළ නොහැකි බවත් පැමිණිලි ලේඛනයක් මේ වන විට සකස් කර ඇති බැවින් දුරකථනයෙන් ලැබෙන පැමිණිලි ද එයට ඇතුළත් කළ හැකි බවත් එමෙන්ම එම පැමිණිලි වලට ගත් ක්‍රියාමාර්ග ද එම ලේඛනයේ සටහන් කළ යුතු බවත් එබැවින් මෙම විෂයන් දෙකම එක් අයෙකුට කළ නොහැකි බව පෙන්වා දෙන ලදී.
- වෙනත් ආයතනවල මෙන් පිළිගැනීමේ නිලධාරී තනතුර සඳහා වැඩ වාර සටහනක් :Roster- සකස් කිරීම- **ගරු සභාපති**
  සුදුසු බව.

➢ **පිළිගැනීමේ නිලධාරී තනතුර සඳහා වැඩ වාර සටහන් ක්‍රමයක් අනුව ආයතනයේ සියලු නිලධාරීන් යෙදවීමට කළමනාකරණ කමිටුව තීරණය කරන ලදී.**

**මූල්‍ය කළමනාකරණ අංශය පිළිබඳව සාකච්ඡා කිරීම**

- ගියවර මාසික සභාවට ගිණුම් ඉදිරිපත් කිරීම සම්බන්ධව විශේෂ අවධානය යොමු කරන බවත් මාසික - **ගණකාධිකාරී**
  සභාවට ගිණුම් වාර්තාව ලබා දීමේ දී ප්‍රමාදයක් සිදු වූ බවත් එය ලොකු දුර්වලතාවයක් බවත් එම දුර්වලතාවය මග හරවා ගැනීමට තමා විසින් යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවත් එනම් සෑම මාසයකම ගිණුම් එළඹෙන මාසයේ 25 වෙනි දිනට පෙර සභාවේ ගරු මන්ත්‍රීවරුන්ට ලබා දීමට ක්‍රියා කරන ලෙස ලිඛිතවද ලබා දී ඇති බවත් එය මේ මාසයේ සිට අනිවාර්යයෙන්ම විය යුතු බවට දන්වා සිටින බවත් පවසා සිටින ලදී.
- සභා වාර්තාවත් සමග ගිණුම් වාර්තා එවීමට කටයුතු කරන ලෙසත් ආදායම් වියදම් වාර්තාව තමන් - **ගරු සභාපති**
  වෙත ලැබුනේ සභාව ආරම්භ කිරීමෙන් පසුව බවත් පෙන්වා දෙන ලදී.
- කාර්ය සාධන තරගය වෙනුවෙන් පසුගිය සතිය තුළ සූදානම් වීමට කාලය ගත වූ බවත් එමෙන්ම ජායා - **ගණකාධිකාරී**
  පිටපත් යන්ත්‍රය ක්‍රියා විරහිත වීමේ හේතුවත් මත ගිණුම් වාර්තා ලබා දීම ප්‍රමාද වූ බව.
- ජායා පිටපත් යන්ත්‍රයේ තත්වය කෙසේද යන්න. - **ගරු සභාපති**
- ජායා පිටපත් යන්ත්‍රය පිළිබඳව තවමත් පරීක්ෂා කර බලන බව අදාළ ආයතනය විසින් ප්‍රකාශ කළ බව. - **ලේකම්**
- වෙනත් ජායා පිටපත් යන්ත්‍රයක් වුවද මිල දී ගැනීම සුදුසු බවත් එකක් ප්‍රධාන පුස්තකාලයට ලබා දිය - **ගරු සභාපති**
  හැකි බවත් එවිට එක් යන්ත්‍රයක් කැඩුණු විට විකල්පයක් පවතින බවත් එබැවින් අලුත් ජායා පිටපත් යන්ත්‍රයක් මිල දී ගැනීමට ක්‍රියා කරන ලෙසත් පවසා සිටින ලදී.
- පුස්තකාලය සඳහා ජායා පිටපත් යන්ත්‍රයක් අවශ්‍ය බවත් පුස්තකාලයට පැමිණෙන්නන් තම අවශ්‍යතා - **පුස්තකාලයාධිපති**
  සඳහා ජායා පිටපත් ලබා ගනුයේ වෙනත්ත වෙළඳ ආයතනයකින් බවත් පෙන්වා දෙන ලදී.
- මේ වන විට නගර සභා ගිණුම අයිරා වී ඇති බවත් අද දින වන විට මෙම තත්වය තවත් වැඩි වනු හැකි- **ගණකාධිකාරී**
  බවත් එයට හේතු වනුයේ සුළු සේවක වැටුප් අද දින ගෙවීමට සිදු වීමත් එමෙන්ම නගර සභාවේ පසුගිය මාස 04ක ආදායම හා වියදම පිළිබඳ (ප්‍රතිපූර්ණ ඉවත් කළ පසු) වාර්තාවක් ඉදිරිපත් කරන බවත් (එම වාර්තාව අමුණා ඇත) ගබඩා ණායහිමි ලේඛනයේ 2012 ඔක්තෝම්බර් මස 19 වැනි දින සිට වවුචර් පත් එකතු වී ඇති බවත් මෙම තත්වය දිගින් දිගටම පැවතුනහොත් භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් ඔවුන්ගේ භාණ්ඩ හා සේවා නගර සභාවට සැපයීම අකමැත්තෙන් වුවද නතර කිරීමට සිදු වන බව දන්වා ඇති බවත් පොදු ගිණුම සමග අත්‍යාවශ්‍ය දේ පමණක් පවත්වා ගෙන යාමට සිදු ව ඇති බවත් මේ සඳහා විකල්පයක් ලෙස 2012ග12ග31 වන දිනට පවතින හිඟ ආදායම් එකතු කිරීම කළ හැකි බවත් පෙන්වා දෙන ලදී .

❖ ගණකාධිකාරී විසින් පෙන්වා දෙන පරිදි රුපියල් ලක්ෂ 26ක පමණ මුදලක් ගෙවිය යුතු බවත් එයින් ලක්ෂ - **ගරු සභාපති**
22 ක මුදලක්වත් සොයා ගත යුතු බවත් ඒ සඳහා ආදායම් අංශයේ නිලධාරීන් රැස් කර සාකච්ජාවක් පැවැත්වූ බවත් එදින ප්‍රධාන ආදායම් නිලධාරී පැමිණ නොසිටි බවත් සියලු නිලධාරීන් වගකීමෙන් කටයුතු කළ යුතු බවත් පෙන්වා දෙන ලදී .

❖ දැන්වීම් පුවරු වල ද හිඟ පවතින බවට ලේඛන වල සඳහන් වන බව. - **ප්‍රධාන ආදායම් කළ.සහකාර**

❖ හිඟ ආදායම් සම්බන්ධව වගකිව යුතු නිලධාරීන් හිඟ ආදායම් එකතු කිරීම සඳහා පෙළඹවීමටත් එහි - **ගරු සභාපති**
ප්‍රගතිය පිළිබඳව සති 02 ට වරක් සාකච්ජා කරන ලෙසත් ඉලක්ක ගත සීමාවක් හා කාලයක් ලබා දෙන ලෙසත් උපදෙස් ලබා දෙන ලදී.

❖ නගර සීමාවේ සෑම වෙළඳ සැලකම බලපත්‍රය ලියවී නොමැති බව පෙනී යන බවත් උපලේඛන ලබා ගන්නා - **ප්‍රධාන කළ:**
නමුත් සෑම වෙළඳසැලක් සඳහාම බලපත්‍රය නොලියවෙන බවත් බලපත්‍ර ලේඛනයේ සටහන් කරනුයේ ද බලපත්‍ර ලබා ගන්නා වෙළඳසැල් පමණක් බවත් උපලේඛන ලබා ගැනීමද සියයට සියයක් සාර්ථක වූ බවක් දැකිය නොහැකි බවත් පවසා සිටින ලදී.

❖ උපලේඛන අනුව ජූනි මස වන විට බලපත්‍ර ලබා නොගත් වෙළඳසැල් සඳහා නඩු දැමීමට ක්‍රියා කරන ලෙස - **ගරු සභාපති**
ත් එසේ නොමැති නම් ඒ සඳහා වගකිවයුතු නිලධාරීන්ගේ වැටුපෙන් හිඟ මුදල් අය කිරීමට කටයුතු කළ යුතු බවටත් උපදෙස් ලබා දෙන ලදී

❖ වෙළඳ සැල්වල පුවරු සම්බන්ධව අධීක්ෂණයක් කිරීම සඳහා තමා සහ ප්‍රධාන ආදායම් කළමනාකරණ - **අ විගණන නිල.**
සහකාර සමග යාමට තීරණය කළ බවත් සුළු ජල බිල්පත් ගාස්තුවක් ජල සම්පාදන මණ්ඩලයට ගෙවීම ප්‍රමාද වුවත් නගර සභාවේ ජල සම්බන්ධතාවය විසන්ධි කිරීමට ජල සම්පාදන මණ්ඩලය ක්‍රියාකරන නමුත් නගර සභාවට ජල සම්පාදන මණ්ඩලයෙන් අය විය යුතු විශාල වරිපනම් බිල සම්බන්ධව ක්‍රියාමාර්ගයක් නොගන්නා බවත් පෙන්වා දෙන ලදී.

❖ වරිපනම් නොගෙවන්නේ නම් වටිනාකමට සරිලන පරිදි ජල මීටර හෝ රැගෙන එන ලෙස. - **ගරු සභාපති**

❖ වර්තමානය වනවිට අපට ලැබිය යුතු වරිපනම් ආදායම අඩු වී ඇති බවත් බොහෝ දේපල වල - **ගණකාධිකාරී**
තක්සේරු වටිනාකම අඩු බවත් එබැවින් නව තක්සේරුවක් කළ යුතු බවත් මැයි 31 වන දිනට පෙර නව තක්සේරුවක් කිරීමට කටයුතු කිරීම සුදුසු බවත් ඒ අනුව නව තක්සේරු වටිනාකම අනුව අය කිරීමට හැකි බවත් පෙන්වා දෙන ලදී.

❖ ආදායම් පරිපාලකට බලය ලබා දී ඇති බවත් වර්තමානය පරිදි තක්සේරු වටිනාකම අඩු දේපල සඳහා- **ගරු සභාපති**
නව තක්සේරුවක් කරන ලෙසත් ඒ අනුව අය කිරීමට කටයුතු කරන ලෙසත් ආදායම් පරිපාලකවරුන්ට දන්වන ලෙස.

❖ දේපල තහනම් කිරීම සඳහා විනිග්‍රහ බලපත්‍ර ද මේ වන විට ලබා දී ඇති බවත් වරිපනම් හා වෙනත් - **ලේකම්**
හිඟ ආදායම් 96 වර්ෂයේ සිට පවතින ඒවා බවත් එම හිඟ අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ කටයුතු කල යුතු බව.

❖ මාස තුනෙන් තුනට පමණ වෙළඳසැල් වල පුවරු සඳහා අධීක්ෂණයක් කරන ලෙසත් මුදල් නොගෙවන - **ගරු සභාපති**
ලද පුවරු ඉවත් කිරීමටත් උපදෙස් ලබා දුන් අතර, නගර සභාවේ යම් මූල්‍ය විනයක් පවත්වා ගෙන යාමට ගත හැකි පියවරයන් මොනවාද යන්නත් ගණකාධිකාරී ගෙන් විමසා සිටින ලදී.

❖ ආරක්ෂක අංශයේ අතිකාල දීමනා අඩු කිරීමට හැකියාව ඇති ද යන්නත් පෙර පාසල් වල සමහර බිල් - **ගණකාධිකාරී**
පත් එක්වර වැඩි වීමත් ආදිය පිළිබඳව සළකා බැලිය හැකි බවත් ජායා පිටපත් යන්ත්‍රය වැනි යන්ත්‍ර අලුත්වැඩියා කිරීමට යන වියදම පිළිබඳව සළකා බැලිය හැකි බවත් පෙන්වා දෙන ලදී.

❖ පෙර පාසල් වල බිල්පත් ආදිය පිළිබඳව පෙර පාසල් සම්බන්ධ කමිටුවේදී සාකච්ජා කිරීමට ප්‍රජා - **ගරු සභාපති**
සංවර්ධන නිලධාරීට ලබා දෙන ලෙස.

❖ නගර සභාවට අයත් කඩ කාමර සඳහා විශාල ජල බිල්පතක් නගර සභාව විසින් ජල සම්පාදන - **ලේකම්**
මණ්ඩලයට ගෙවනු ලබන බව හා එම වියදම් කරනු ලබන මුදලම කඩ කාමරවලින් නගර සභාවට අය නොවන බව.

❖ ජල සම්පාදන මණ්ඩලයට අප විසින් ජල මනු නැවත සවි කරන ලෙස ඉල්ලීමක් කළ බවත් ඒ අනුව අප - **වැඩ අධිකාරී** විසින් කළ යුතු මූලික වැඩ කොටස අවසන් කර ඇති බවත් ජලසම්පාදන මණ්ඩලයට ලිඛිතව ඉදිරි වැඩ කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දන්වා යැවූ බවත් අනතුරුව ගරු සභාපතිතුමාගේ අත්සනින් යුත් ඇස්තමේන්තු වක් සකස් කර ඉල්ලීමක් එවන ලෙස දන්වා එවා ඇති බවත් ඉන් අනතුරුව සිදු වූ දේ කුමක්ද යන්න පිළිබඳව තමා නොදන්නා බවත් පවසා සිටින ලදී.

(මේ අවස්ථාවේ දී විෂය ලිපිකරු කමිටුවට කැඳ වූ ගරු සභාපතිතුමා ඉදිරි පියවර පිළිබඳව විමසා සිටි අතර, මේ වන තෙක් අප විසින් යවන ලද ලිපියට ජල සම්පාදන මණ්ඩලයෙන් ලිඛිත පිළිතුරක් නොලැබුණු බව පවසා සිටි අතර, ජල සම්පාදන මණ්ඩලයේ ස්ථාන භාර නිලධාරීට එම අවස්ථාවේදීම දුරකථනයෙන් පවසා සිටියේ අප ගේ අවශ්‍යතාවයට මූලිකත්වය ලබා දී කටයුතු කරන ලෙසත් විෂය ලිපිකරු හමු වී අදාළ කරුණු පිළිබඳව සාකච්ඡා කරන ලෙසත්ය)

❖ ඡායා පිටපත් යන්ත්‍රය භාවිත කිරීමේ දී භාවිත කරන්නන්ට ලේඛනයක් නඩත්තු කරන ලෙස දැන්වීම - **අ විගණන නිලධාරී** සුදුසු බව.

❖ ඡායා පිටපත් යන්ත්‍රයේ අප විසින් ගනු ලබන පිටපත් ප්‍රමාණය ඉතා අධික බව යන්ත්‍රය නඩත්තු කිරීමට - **ප්‍ර කළ: සහකාර** පැමිණි මුල් අවස්ථාවේදීම අදාළ ආයතනයේ නිලධාරී මහතුන් පැවසූ බව.

❖ ඡායා පිටපත් යන්ත්‍රය මගින් ඡායා පිටපත් ලබා ගැනීම පමණක් නොව පරිගණක මුද්‍රිත පිටපත් ලබා - **ලේකම්** ගැනීම ආදිය ද සිදු කරන බව.

❖ ලබා ගත හැකි උපරිම ඡායා පිටපත් ප්‍රමාණය ලබා ගෙන ඇත්නම් හා යන්ත්‍රය නැවත අලුත්වැඩියාව - **ගරු සභාපති** සඳහා යන වියදම අධික නම් නව යන්ත්‍රයක් මිල දී ගැනීම සුදුසු බව.

❖ ගලි බවුසරයට ස්ථාවර නියෝගයක් දී ඇති බවත් බැංකුවේ පොදු ගිණුමේ මුදල් නොතිබීම හේතුවෙන් - **ගණකාධිකාරී**

❖ මාස 3 ක් 4 ක් පමණ ප්‍රමාද වී වාරිකය ගෙවෙන බවත් මෙලෙස ණය වාරික ගෙවීම යහපත් නොවන - **ගණකාධිකාරී** බවත් එබැවින් හිග ආදායම් එකතු කර ආදායම් තත්වය වැඩි කර ගිණුමේ තබා ගත යුතු බවත් දිගින් දිගටම ණය වාරික ප්‍රමාද වීම සුදුසු නොවන බවත් එමෙන්ම නගර සභාවේ ආදායම් හා වියදම් තත්වය බලා යෝජනා 03 ඉදිරිපත් කරන බවත් ඉන් එක් යෝජනාවක් නම් ඉහතින් සඳහන් කල පරිදි අතිකාල, යන්ත්‍ර සූත්‍ර ආදිය නඩත්තුවට යන වියදම් ආදිය අවම කර ගැනීම බවත් දෙවන යෝජනාව ලෙස කඩකුලී වලින් තුනෙන් එකක් ලෙස නගර අලංකරන ගිණුමට බැර කරන මුදල් එම ගිණුම ඉවත් කර නැවත පොදු ගිණුමට බැර කිරීම (සභා අනුමැතිය මත) සුදුසු බවත් තෙවන යෝජනාව ලෙස මුද්දර ආදායමෙන් 20% ක් පොදු ගිණුමට බැර කිරීම සුදුසු බවත් ආදී ලෙස යෝජනා තුන විස්තර සහිතව පැහැදිළි කරන දෙන ලදී. (ඇමුණුමේ දක්වා ඇත)

❖ නගර අලංකරණ ගිණුමෙන් නගර අලංකරණ කටයුතු සිදු නොකළ බවත් එම ගිණුමෙන් සැපයුම් බිල්පත් - **ගරු සභාපති** සඳහා ගෙවීම් කළ බවත් ඕනෑම ආපදා අවස්ථාවක දී මෙම ගිණුමෙන් අවශ්‍ය කටයුතු සඳහා මුදල් ලබා දුන් බවත් මුද්දර ගාස්තු ප්‍රාග්ධන ගිණුමට බැර කරනුයේ ජනතාවට කිසියම් දෙයක් අප විසින් කළ යුතු බැවින් බවත් සියලු දේ සඳහා මුදල් ලබා දුන් විට නිලධාරීන්ට කිරීමට කාර්යයක් නොමැති බවත් එවිට හිග ආදායම් ආදිය එකතු කිරීමක් සිදු නොවන බවත් පෙන්වා දෙන ලදී.

❖ හිග ආදායම් එකතු කිරීම හා එහි ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා මේ මස 22 වන දින රැස්වීමක් පැවැත් - **ගණකාධිකාරී** සුදුසු බව.

❖ ලබන සතියේ මුදල් එකතු කිරීම සඳහා නිලධාරීන් යොදවා ඇති බැවින් ඉන් පසුව පැවැත් වීම සුදුස බව.- **ප්‍ර ආකළ:සහකාර**

❖ හිග එකතු කිරීම පමණක් නොව දිගින් දිගටම හිග නොගෙවා සිටින්නන් වෙනුවෙන් යම් ක්‍රියාමාර්ගයන් - **ප්‍ර කළ: සහකාර** අනිවාර්යයෙන්ම ගත යුතු බව.

❖ අනිවාර්යයෙන්ම ගත යුතු බව. - **ගණකාධිකාරී**

❖ හිමාල් මහතා මුද්දර ආදායම් ගෙන ඒම සඳහා යොදවා සිටි බවත් ආදායම් අංශයෙන් ඉවත් කිරීමෙන් - **ලේකම්** එම කාර්ය යම් තාක් දුරකට ප්‍රමාද වූ බවත් දැනට යොදවා ඇති විෂයය සමග මුද්දර ආදායම් එකතු කිරීමේ කාර්යය කළ නොහැකි බවත් පෙන්වා දෙන ලදී.

❖ හිමාල් මහතා සුදුසු කාර්යයට යොදවන ලෙස. - **ගරු සභාපති**

- ❖ හිමාල් මහතා ට මාසයකට වරක් පමණක් බිල්පත් නිදහස් කිරීමට ඇති බවත් වෙනත් රාජකාරි කටයුතු - **ගණකාධිකාරී** නොමැති නම් මුද්දර ගාස්තු අය කර ගැනීමට යැවිය හැකි බවත් පෙන්වා දෙන ලදී.
- ❖ ක්ෂේත්‍ර නිලධාරීන් වෙනුවෙන් ඉදිරි වැඩසටහන් සැළැස්මක් ලබා දිය යුතු බවට විමර්ශන නිලධාරීන් පවසා- **ප්‍ර. ආ කළ: ස.** සිටි බවත් ඒ අනුව ආදායම් පරිපාලකවරුන්ගෙන් තමා ඉදිරි වැඩසටහන් පිළිබඳව ඉල්ලා සිටි බවත් එවිට මෙතෙක් කල් එවැනි ඉදිරිවැඩසටහන් ලබා නොදුන් බව ආදායම් පරිපාලකවරු තමාට දැන්වූ බවත් පවසා සිටින ලදී.
- ❖ ආදායම් අංශයේ ආදායම් පරිපාලකවරු දෙදෙනෙක් සිටිය දී නඩු පැවරීම ආදී කටයුතු වෙනුවෙන් හිමාල් - **ප්‍රකළ: සහකාර** මහතා යොදවා ගැනීම ආදී හේතු මත ආදායම් අංශයෙන් ඉවත් කර පරිපාලන අංශයට යොදවා ගැනීමට සිදුවූ බව.
- ❖ ආයතනය තුළ යම් කාර්යය පාලනයක් ඇති කළ යුතු බවත් අවශ්‍ය දේ සඳහා අවශ්‍ය නිලධාරීන් යොදවන- **ගරු සභාපති** ලෙසත් නඩු පැවරීමේ දී හා නඩු සඳහා යාමේ දී නඩු අංකය, දිනය හා නඩුව දැනට පවතින අදියර ආදිය සටහන් කර තිබිය යුතු බවත් ඉදිරි වැඩ කටයුතු ඒ අනුව සකස් විය යුතු බවත් නිදසුනක් වශයෙන් පැහැදිළි කර දෙන ලදී.

- ❖ පසුගිය විගණන විමසුම් අනුව ව්‍යාපෘතිය සඳහා බඳවා ගන්නා ලද සේවකයන් පිළිබඳ කළමනාකරණ - **ලේකම්** සේවා දෙපාර්තමේන්තුවෙන් විමසීම සම්බන්ධව සොයා බලන ලෙස.
- ❖ රටේ පවතින යම් නීතියක් වේ නම් එයට අනුකූලව යම් යම් දේ ගලපා ගැනීම නිළධාරීන්ගේ වගකීම බවත්- **ගරු සභාපති** විගණන විමසුම් වලට අනුව ව්‍යාපෘතිය සඳහා බඳවා ගන්නා ලද සේවකයන් පිළිබඳව හා නගර ක්‍රීඩා උත්සවයේ වියදම් පිළිබඳව නැවත සළකා බලන ලෙස දන්වා යැවීම සුදුසු බව.

➢ **හිග ආදායම් එකතු කිරීමටත් එහි ප්‍රගතිය සතියකට වරක් සාකච්ඡා කිරීමටත් නගර සභාවේ ආදායම් හා වියදම් තත්වය පිළිබඳව කරනු ලබන යෝජනා පිළිබඳව සළකා බැලීමට සභාවට යොමු කිරීමටත් කළමනා කරණ කමිටුව තීරණය කරන ලදී.**

**සංවර්ධන හා සැළසුම් අංශය පිළිබඳව සාකච්ඡා කිරීම.**

- ❖ මෙවර කාර්ය සාධන තරගය සඳහා පැමිණි විනිශ්චයකරුවන් විසින් මාර්ග ඉන්වෙන්ට්‍රිය ගැසට් කිරීමට - **වැඩ අධිකාරී** කටයුතු කරන ලෙසට දැන් වූ බවත් එය කළ යුතු බවත් මාසයක් පමණ කල් ලබා දී එම කටයුත්ත අවසන් කිරීමටත් මේ සඳහා අවශ්‍ය සියලු උපදෙස් අදාළ විෂය භාර තාක්ෂණ සේවා නිලධාරීට ලබා දී ඇති බවත් ඒ අනුව නිවැරදි මාර්ග ඉන්වෙන්ට්‍රියක් සකස් විය යුතු බවත් පෙන්වා දෙන ලදී.
- ❖ මාර්ග ඉන්වෙන්ට්‍රියක් සකස් කර තිබුච්ට ආයතනයේ සිටම කිසියම් මාර්ගයක් සඳහා ඇස්තමේන්තුව සකස්- **ගරු සභාපති** කළ හැකි බව හා කොට්ඨාස 13 වෙන් කර එක සතියකට එක් කොටසක් වන ලෙස සකස් කිරීමට භාර දෙන ලෙස.
- ❖ ට්‍රැක්ටර් ටේලර් වලට අවශය භාණ්ඩ වගයක් ඇණවුම් කර ඇති නමුත් තවමත් භාණ්ඩ නොලැබුනු බව.- **වැඩ අධිකාරී**
- ❖ වාහන සේදීම සඳහා කාලසටහනක් සකස් කර දෙන ලෙස හා සුදුසු ස්ථානයක් සකස් කර දෙන ලෙස. - **ලේකම්**

➢ **මාර්ග ඉන්වෙන්ට්‍රිය මාසයක් ඇතුළත සකස් කර ගැසට් කිරීමට කටයුතු කිරීමට කළමනාකරණ කමිටුව තීරණය කරන ලදී.**

**ප්‍රජා සේවා අංශය පිළිබඳව සාකච්ඡා කිරීම.**

- ❖ විද්‍යුත් පුස්තකාලය සඳහා පරිගණක දත්ත ක්‍රියාකරු වන නිලන්ති මිය සහ පුස්තකාල සහායකයින් - **ප්‍රධාන කළ: සහකාර** දෙදෙනෙකු පුහුණු කළ යුතු බවට ගරු සභාපතිතුමා උපදෙස් ලබා දුන් බව.

- විදුහුත් පුස්තකාලය සකස් කර දීමේ කාර්යය කළ හැකි නමුත් එයට අදාළ භාණ්ඩ හෝ ස්ථාන ගත කිරීම- **වැඩ අධිකාරී** සම්බන්ධව හෝ තමාට අදහසක් නොමැති බවත් මෙම ව්‍යාපෘතියට අදාළ දේවල් පිළිබඳව දන්නා නිලධාරීන් එයට සම්බන්ධව කටයුතු කළ යුතු බවත් පෙන්වා දෙන ලදී.
- මේ සම්බන්ධව වැඩ අධිකාරි, පුස්තකාලයාධිපති හා පරිගණක දත්ත ක්‍රියාකරු ආදි නිලධාරීන් එකතු වී - **ප්‍ර කළ: සහකාර**
- සාකච්ඡා කිරීම සුදුසු බවත් මේ කාර්යය සඳහා ප්‍රමුඛත්වය දී කටයුතු කළ යුතු බවත් පෙන්වා දෙන ලදී.
- 2013 වර්ෂය සඳහා කියවීමේ මාසයේ වැඩ කටයුතු සඳහා සුදානම් වීමත් , සංස්කෘතික අමාත්‍යාංශයෙන් - **ලේකම්** ලබා දෙන ලද (කතෘ ප්‍රකාශන) පොත් ලබා ගැනීම සඳහා දැන්ම ඉල්ලීමක් කරන ලෙස.

- **විදුහුත් පුස්තකාලය සඳහා මූලිකත්වය ලබා දී කටයුතු කිරීමටත් අවශ්‍ය නිලධාරීන් පුහුණු කිරීමටත් කළමනාකරණ කමිටුව තීරණය කරන ලදී.**

**සෞඛ්‍ය හා පරිසර අංශය පිළිබඳව සාකච්ඡා කිරීම**

- ඩෙංගු මර්ධනය කිරීමේ වැඩපිළිවෙල දිගටම කර ගෙන යාමටත් ඒ සඳහා ප්‍රජා සංවිධාන වල සහාය - **ලේකම්** ලබා ගැනීමට කටයුතු කිරීමටත් පියවර ගැනීම සුදුසු බව.
- හල්වතුර කසල බැහැරලන ස්ථානයේ කසල ගොඩ ගැසී ඇති බවත් කසල තුනී කිරීමේ යන්ත්‍රය ක්‍රියා - **මසෞඛ්‍ය පරීක්ෂක** විරහිත වීම මෙයට හේතු වී ඇති බවත් යන්ත්‍රය නැවත සකස් කළ පසුව කසල තුනී කළ හැකි බවත් ඩෙංගු මර්ධන ක්‍රියාවලිය දිගටම කරන බවත් පවසා සිටින ලදී.
- මැයි 22 වන දිනට යෙදී ඇති ජනරජ දිනය සැමරීමටත් ජුනි 25 වන දිනට යෙදෙන ලෝක පරිසර දිනය - **ලේකම්** සැමරීමටත් වැඩපිළිවෙලක් සකස් විය යුතු බවත් ගලි බවුසර සේවාව හා කසල ඉවත් කිරීමේ සේවාව සම්බන්ධව අප විසින් අය කරනු ලබන ගාස්තුව සංශෝධනය විය යුතු බවට ගරු සභාපතිතුමා සමග ද සාකච්ඡා කළ බවත් ඒ සඳහා අවශ්‍ය පියවර හැකි ඉක්මණින් ගන්නා ලෙසත් පවසා සිටින ලදී .
- වෙනත් පළාත් පාලන ආයතන වලින් ඉහත කරුණු සඳහා අය කරනු ලබන ගාස්තු පිළිබඳව සොයා බලා - **මසෞ පරීක්ෂක** ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කිරීම සුදුසු බව.

- **ගලි බවුසර හා කසල ඉවත් කිරීමේ කටයුතු වෙනුවෙන් අය කරනු ලබන ගාස්තු සංශෝධනය කිරීමටත් අවශ්‍ය පියවර ගැනීම සුදුසු බව කළමනාකරණ කමිටුව තීරණය කරන ලදී.**

- කිසිම අධීක්ෂණ නිලධාරියෙකු නොමැතිව 2013 කාර්ය සාධන තරගය වෙනුවෙන් පිරිසිදු කිරීමේ ආදී - **අ. විගණන නිල.** කටයුතු කළ බව පවසා අතිකාල දීමනා ඉල්ලුම් කර ඇති බවත් අධීක්ෂණ නිලධාරියෙකු නොමැතිව අතිකාල ලබා ගැනීම සඳහා වැඩ කටයුතු කළ නොහැකි බවත් ඒ පිළිබඳව සැළකිලිමත් විය යුතු බවත් පෙන්වා දෙන ලදී.
- පාර පලුදු කිරීමේ පෝරම තමා වෙත එවීමේ දී ලේඛනයක සටහන් නොකර එවන බවත් එබැවින් ලේඛන - **වැඩ අධිකාරී** යක් නඩත්තු කර පවත්වා ගෙන යන ලෙස විෂය ලිපිකරුට දන්වන ලෙසත් පවසා සිටින ලදී.
- නගර සභා වෙබ් අඩවිය සඳහා එක් එක් අංශයන්ගෙන් අදාළ තොරතුරු ලබා දී නොමැති බැවින් ඒ - **ලේකම්** සඳහා තොරතුරු ලබා දෙන ලෙස.
- බලංගොඩ නගර සභාවේ වෙබ් අඩවිය සකස් කර ඇති පරිදි කිසියම් ආකෘතියක් ලබා දෙන ලෙස. - **අංශ ප්‍රධානීන්**

**02. රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.**

❖ ස්තුති කථාව කිරීම සහ රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම. **- ප්‍රධාන කළ: සහකාර**

සකස් කළේ : මංජරී ත්‍යාගා සමරසේකර (සංවර්ධන සහකාර)

අත්සන : ………………..

දිනය : …………………

ලේකම්,
නගර සභාව - අම්බලන්ගොඩ

**ඒ අනුව 2013 -05- 10 දින පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2** **2013- 05- 21** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද වෙළඳ සංගම් කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

**දිනය** : **2013.05.21**

**ස්ථානය** : **නගර සභාව, අම්බලන්ගොඩ**

**වේලාව** : **ප.ව. 2.30**

**සහභාගීත්වය** :

**ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මයා - ගරු සභාපති, නගර සභාව, අම්බලන්ගොඩ**
**ආර්. පී. දේව් රෝහාන් මයා - ගරු නගර සභා මන්ත්‍රී, නගර සභාව, අම්බලන්ගොඩ**
**අසිත ධනවංශ මයා - සම ලේකම්, වෙළඳ සංගමය, අම්බලන්ගොඩ**
**සුජීව සොයිසා මයා - භාණ්ඩාගාරික, වෙළඳ සංගමය, අම්බලන්ගොඩ**
**සමන් අත්තනායක මයා - උපභාණ්ඩාගාරික, වෙළඳ සංගමය, අම්බලන්ගොඩ**
**ඩී. වී. සුනිල් මයා - ලේකම්, නගර සභාව, අම්බලන්ගොඩ**
**මංජරී ත්‍යාගා සමරසේකර මිය - සංවර්ධන සහකාර, නගර සභාව, අම්බලන්ගොඩ**

01. පිළිගැනීම **- ගරු සභාපති, නගර සභාව**

❖ අම්බලන්ගොඩ නගරයේ නැවත පිරිත් දේශනා (පෙරවරුවේ සහ පස්වරු කාලයේ) විකාශය කරන ලෙස නිර්නාමික ලිපියකින් ඉල්ලා සිටින ලද බවත් එය වෙළඳ සංගමය මගින් කරන ලද කාර්යයක් බැවි ලිපියේ සඳහන් කර තිබූ බැවින් හා වැදගත් යෝජනාවක් බැවින් වෙළඳ සංගම් කමිටුවට ඉදිරිපත් කළ බව. **- ගරු සභාපති, නගර සභාව**

❖ නගර බදව පිරිත් විකාශය කිරීම වෙළඳ සංගමය විසින් කළ බවත් එම කාර්යය නැවැත්වීමට සිදු වූයේ විකාශය සඳහා වූ වයර් කපා දැමීම ආදී ගැටලු මතු වූ හේතුවෙන් බවත් නැවත පිරිත් විකාශය කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කර ගෙන යමින් පවතින බවත් පවසා සිටින ලදී. **- සමලේකම්, වෙළඳ සංගමය**

❖ වෙළඳ සංගමය විසින් ප්‍රදර්ශනය කරනු ලබන තොරණ සඳහා නගරසභා අවසරය ලබා ගැනීමට ඉල්ලීමක්- ගරු සභාපති, නොකලේ ද යන්න හා එසේ ඉල්ලීමක් කරනු ලබන්නේ නම් නගර සභාවේ මාසික සභාව පැවැත්වීමට පෙර කරන ලෙස හා එසේ නොමැති වූ විට ගැටලු මතු වන බව.

❖ මෙවර වෙසක් තොරණ ප්‍රදර්ශනය නොකිරීමට තීරණය කරන ලද නමුත් බොහෝ දෙනෙකුගේ ඉල්ලීම මත- වෙළඳ සං. නිලධාරීන් අවසානයේ දී ප්‍රදර්ශනය කිරීමට තීරණය කරන ලද බවත් එබැවින් බොහෝ දුෂ්කරතාවයන්ට මුහුණදීමට ද සිදු වූ බවත් නගර සභා අවසරය ලබා ගැනීමට ලිපියක් ඉදිරිපත් කර ඇති බවත් එමෙන්ම පොලිසියේ සහාය හා අවසරය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන්ගේ අත්සනින් යුතු අවසර ලබා දීමේ ලිපියක් අවශ්‍යව ඇති බවත් පවසා සිටින ලදී.

❖ උත්තල දර්පණ ලබා දීම සම්බන්ධව වූ වැඩ කටයුතු කෙසේද යන්න. - ගරු සභාපති ,නගර සභාව

❖ උත්තල දර්පණ ලබා දීමේදී පියාපියෝ ආයතනයෙන් නගර සභාව දර්පණ පමණක් ලබා දීමට ඉල්ලීමක් - උපභාණ්ඩාගාරික, කර තිබූ බැවින් දර්පණවල මුදල් පමණක් වෙන් කර තිබූ බවත් නැවත දර්පණ සවි කිරීම ආදී අනෙකුත් ද්‍රව්‍ය සඳහා යන මුදල් ද ඇතුළුව නව ඇස්තමේන්තුවක් සකස් කර ඉදිරිපත් කළ බැවින් එයට අනුමැතිය ලබා දී එම ලිපිය නගර සභාවට ලැබීමට සළස්වනු ඇති බවත් එවිට නගර සභාව විසින් අදාළ සියලු කාර්යයන් ඉටු කර එනම් දර්පණ සවි කිරීම අවසන් කර පියාපියෝ ආයතනයට දැන්වූ විට බිල්පත් ගෙවීමට කටයුතු කරන බව.

❖ අම්බලන්ගොඩ පොලිසියේ රථ වාහන අංශයේ ස්ථානාධිපති ස්ථාන මාරු ලැබ යන හෙයින් නැවත අලුතෙන් - සම ලේකම්, පැමිණෙන ස්ථානාධිපති සමග නගර සභාව, වෙළඳ සංගමය හා පොලිසිය එක්ව සිදු කර ගෙන යනු ලබන වැඩ වෙළඳ සංගමය සාකච්ඡා කර ඉදිරියට පවත්වා ගෙන යා යුතු බවත් අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමන්ගේ ද ඉල්ලීම පරිදි උත්සව කාලයේ දී රථ වාහන පොලිසියෙන් විශාල සේවයක් වූ බවත් එබැවින් සහකාර පොලිස් අධිකාරී, රථ වාහන අංශයේ ස්ථානාධිපති හා මූලස්ථාන පොලිස් පරීක්ෂක ඇතුළු සියලු පොලිස් නිලධාරීන්ට වෙළඳ සංගමයේ ස්තූතිය හිමි වන බවත් එමෙන්ම මෙම සහයෝගය දිගින් දිගටම අවශ්‍ය වන බවත් පවසා සිටින ලදී.

❖ නගරයේ සිටින සෑම ව්‍යාපාරික ස්ථානයක්ම ගියවර වෙසක් කාල සීමාව තුල දී මෙන් වෙසක් සැරසිලි වලින් - උප භාණ්ඩාගාරික, අලංකාර කරන ලෙස දන්වා මෙවරද ලිපියක් යැවීම සුදුසු බව. වෙළඳ සංගමය විසින් ඔවුන්ට තාවකාලික වෙළඳ බලපත්‍රයක් නිකුත් කරන බවත් පුද්ගලික ඉඩම් ලබා දීම නවතා දැමීමට හැකියාව

❖ සියලු බැංකු හා රක්ෂණ ආයතන වෙළඳ සංගමය මගින් දැනුවත් කළ බවත් එලෙස අනෙකුත් ව්‍යාපාරිකයන් - සම ලේකම්, දැනුවත් කිරීම ත් සුදුසු බව. වෙළඳ සංගමය

**02. රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.**

ස්තුති කථාව කිරීම සහ රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම. - **ගරු නගර සභා මන්ත්‍රී, ආර්.පී. දේවි රෝහාන් මයා**

සකස් කළේ : ..............................................

අත්සන : ......................................

ලේකම්,
නගර සභාව - අම්බලන්ගොඩ.

ඒ අනුව **2013 -05-21** දින පවත්වන ලද වෙළඳ සංගම් කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**6: 3** **2013- 05- 20** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂමි හේමන්තා මෙනවිය විසින් ස්ථිර කරන ලදී.

<u>2013 මැයි මස 20 වැනි දින ප.ව. 2.30 ට පැවැත් වූ පුස්තකාල කමිටු වාර්තාව</u>

| | |
|---|---|
| 01. ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| 02. ග්‍රේෂන් කෙරමිණියගේ මහතා | ගරු නගරසභා මන්ත්‍රී |
| 03. ඩබ්.පී. සිල්වා මිය | ප්‍රජා සංවර්ධන නිලධාරි |
| 04. කේ.එච්. මෙලනි මධුෂා මිය | පුස්තකාලයාධිපති |
| 05. හර්බට් වීරක්කොඩි මහතා | කමිටු සාමාජික |
| 06. සිරිපාල මාදුවගේ මහතා | කමිටු සාමාජික |
| 07. පී.එච්.එල්. පියන්ති මෙනවිය | පුස්තකාල සහායිකා |
| 08. ඒ.ඩබ්. ඉන්දුදාස මහතා | පුස්තකාල සහායක |
| 09. ඒ.පී. රසිකා මිය | පුස්තකාල සහායිකා |
| 10. ගෞරි වරුෂවිතාන මිය | පුස්තකාල සහායිකා |
| 11. එච්.ඩබ්.ජේ. සුමංගලී මිය | පුස්තකාල සහායිකා |
| 12. ලක්ෂ්මි කාන්තා පෙරේරා මෙනවිය | පුස්තකාල සහායිකා |
| 13. ඩී.එම්.පී.එස්. දිල්රුක්ෂි මිය | පුස්තකාල සහායිකා |
| 14. එස්.එම්. මනෝරි චන්ද්‍රවංශ මිය | පුස්තකාල සහායිකා |

<u>**මූලාසනය**</u>

ගරු සභාපතිතුමා ස්වේච්ඡාවෙන් කමිටුවට පැමිණි සියලුම කමිටු සාමාජික මහතුන් ප්‍රජා සංවර්ධන නිලධාරිනි ඩබ්.පී. සිල්වා මිය, පුස්තකාලයාධිපති කේ.එච්. මෙලනි මදූෂා මිය ඇතුළු පුස්තකාල කාර්ය මණ්ඩලය පිළිගැනීමෙන් කමිටුවේ වැඩ ආරම්භ කරන ලදි.

01. පුස්තකාල ප්‍රගති වාර්තාව කමිටුවට ඉදිරිපත් කිරීම
ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පුස්තකාලයාධිපති කේ.එච්. මෙලනි මදූෂා මහත්මිය විසින් ද අනෙකුත් ශාඛා පුස්තකාලවල ප්‍රගති වාර්තා ඒ ඒ ශාඛා භාර නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලදි. ඕකන්ද ශාඛා පුස්තකායේ ප්‍රගති වාර්තාව පී.එච්.එල්. පියන්ති මෙනවිය විසින්ද හිරේවත්ත ශාඛා පුස්තකාලයේ ප්‍රගති වාර්තාව ඩී.එම්.පී.එස්. දිල්රුක්ෂි මහත්මිය විසින්ද ඉදිරිපත් කරන ලදි.

02. 2.1 කමිටු සාමාජික යූ.ඩබ්ලිව්. ඥානසිරි මහතා විසින්

- වෛද්‍ය විද්‍යාව පාරිභාෂික ශබ්ද මාලාව
- A Pictorial Biography of Salagamuni Buddha
- Buddhism Key stage I

යන ග්‍රන්ථ තුනක් ප්‍රධාන පුස්තකාලය වෙත පරිත්‍යාග කිරීම පිළිබඳව ගරු සභාපති තුමාගේ ස්තුතිය ප්‍රකාශ කරන ලදි.

2.2 යූ.ඩබ්ලිව්. ඥානසිරි මහතා එතුමාට රැකියාවක් ලැබීම හේතුකොට ගෙන සෑම කමිටු වාරයකටම සහභාගිවීමට නොහැකි බව පවසමින් කමිටු සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමේ සඳහා එවනු ලැබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.
කමිටු සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වුවත් එතුමාට නිදහස් සෑම අවස්ථාවකදීම කමිටුවට අවශ්‍ය උපරිම සහයෝගය ලබාදෙන බව ප්‍රකාශ කර ඇති බවද ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

03. ඉන්පසුව ගරු සභාපතිතුමා, පාඨක අදහස් ලේඛන පරීක්ෂා කිරීමෙන් පසුව පෝරඹ ශාඛා පුස්තකාලයේ සේවය කරන ලක්ෂ්මි පෙරේරා මෙනවියගෙන් විමසා සිටියේ එහි සඳහන් කර ඇති පොත් තවමත් නොලැබුනේ ඇයිද යන්නයි.

පෝරඹ පුස්තකාලයේ පාඨකයකු විසින් එම පොත් ලැයිස්තුවෙන් පොත් දෙක තුනක් පරිත්‍යාග කිරීම සඳහා පොත් ලැයිස්තුව රැගෙන ගිය බව ලක්ෂ්මි පෙරේරා මෙනවිය විසින් ගරු සභාපතිතුමා වෙත දන්වා සිටින ලදී.

තීරණය

3.1 එයට ගරු සභාපතිතුමා අදහස් දක්වමින් කියා සිටියේ කෙසේ හෝ මෙම ඉල්ලීම සති දෙකක් ඇතුලත එම පාඨකයන්ට ඉෂ්ඨ කර දෙන ලෙසයි.

3.2 තවද කෙරමිණිය ශාඛා පුස්තකාලය වෙතද ඉල්ලා ඇති පොත් ලැයිස්තුවද එයට ලබාදෙන ලෙස ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.
ප්‍රධාන පුස්තකාලයේ පාඨකයන් විසින් ඉල්ලා තිබූ දුම්රිය පිළිබඳ පොතද පත්තර හැකි ඉක්මනින් කියවා බලා අනෙකුත් පාඨකයන් වෙත ලබා දෙන්නයියි ලෙස ලියවුණ දැන්වීමද යන ඉල්ලීම් දෙකම ඉටුකර ඇති වග සභාපති තුමා විසින් ප්‍රකාශ කරන ලදී.

3.3 පුස්තකාලයේ විස්තරවලට අමතරව ඇති අඩුපාඩුකම් පිළිබඳව යම් දෙයක් දැනුම්දීමට අවශ්‍ය නම් එය මෙම පාඨක අදහස් පොතේ සටහන් කරන ලෙස පාඨකයන්ට දැන්වීම සඳහා සියලුම ශාඛාවල දැන්වීමක් ප්‍රදර්ශනය කරන ලෙස ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

04. 4.1 ඕකන්ද පුස්තකාලයට අවශ්‍ය රිවිර පුවත්පත ලබගැනීම සඳහා පාඨක සමීක්ෂණයකින් පසුව රාවය නවතා රිවිර ලබාගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

4.2 තවද හැකිනම් ගරු නාගරික මන්ත්‍රීවරයෙකුගේ ආධාරය මත සෑම සතියකම එය ලබාගැනීමට කටයුතු සලස්සවා ගන්නා ලෙසද ශාඛා පුස්තකාල සහායිකාවන් හට ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

4.3 මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයට ද රිවිර පුවත්පත ලබාදිය යුතු බව කමිටු සාමාජික හර්බට් වීරක්කොඩි මහතා විසින් පවසන ලදී. එතුමා තවදුරටත් කියා සිටියේ රාවය පුවත්පත කියවන පාඨකයින් අඩු බැවින් එම පුවත්පත ඉවත්කර රිවිර පුවත්පත ලබාදෙන ලෙසයි.

තීරණය
ගරු සභාපතිතුමා විසින් මෙම ඉල්ලීම ඉටුකර දෙන ලෙස පවසන ලදී.

05. 5.1 පුස්තකාලයේ පොත් පරිගණක ගත කිරීමට අවශ්‍ය දැනුම ලබා ගැනීමට පරිගණක පුහුණුව සඳහා පස් දෙනෙකු සහභාගි කරවන ලෙස පුස්තකාලයාධිපතිතුමියට ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

5.2 රාජ්‍ය පරිපාලනයෙන් ලබාදෙන පුහුණුව සඳහා අනෙකුත් සියලුම ස්ථිර පුස්තකාල සහායිකාවන් සහභාගි කරවන ලෙස ගරු සභාපතිතුමා ප්‍රජා සංවර්ධන නිලධාරිනියට පවසන ලදී.

06. ප්‍රධාන පුස්තකාලයට සුචි කාඩ්පත් 20000 ක් පමණ අවශ්‍ය බව පුස්තකාලයාධිපතිනිය විසින් පවසන ලදී. ශාඛාවලටද එම සුචි කාඩ්පත් හා සුචි කැබිනට්ටුවක් බැගින් අවශ්‍ය බව ගෞරී වර්ෂවිතාන මහත්මිය විසින් පවසන ලදී. ප්‍රධාන පුස්තකාලයට බැහැරදෙන අංශය සඳහා සුචි කැබිනට්ටු හිඟ බව පුස්තකාලයාධිපතිනිය විසින් ප්‍රකාශ කරන ලදී.

තීරණය :-
අවශ්‍ය සියලුම සුචි කාඩ්පත් හා සුචි කැබිනට්ටු මිලදී ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් පවසන ලදී. පුස්තකාල සේවා මණ්ඩලයට ලැබුණු පොත් මොනවාදැයි යන්න ගරු සභාපතිතුමා විසින් පුස්තකාලයාධිපතිතුමියගෙන් විමසන ලදී.

එහිදී වටිනා ඉංග්‍රීසි පොත් 25 ක් ප්‍රධාන පුස්තකාලය වෙත ලැබුණු බව පුස්තකාලායාධිපතිනිය විසින් පවසන ලදී.

07. මාර්ටින් වික්‍රමසිංහ පදනමේයියි කුමුදුනි සද්ධාසේන මහත්මිය වෙත ලිපියක් යැවීම මගින් වටිනා පොත් 500කට අධික ප්‍රමාණයක් ගෙන්වා ගත හැකි බව කමිටු සාමාජික හර්බට් වීරක්කොඩි මහතා විසින් පවසන ලදී.

ප්‍රධාන පුස්තකාලයේ සියලුම පොත් Scan කර තැටි (CD) තුළට සහ Pen තුළට ලබාගැනීම සඳහා පුස්තකාලයට සහය දක්වන ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියගෙන් ගරු සභාපතිතුමා ඉල්ලා සිටින ලදි. ගරු නාගරික මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා මේ අවස්ථාවේ කමිටු රැස්වීමට පැමිණෙන ලදි.

ඕකන්ද පුස්තකාලයේ සේවය කරන පුස්තකාල සහයිකාවක් වන මාලනි ආරියසිංහ මහත්මියගේ මෑණියන්ගේ ආදාහනයට සහභාගිවීමට ඇති හෙයින් කමිටුවේ වැඩ අවසන් කිරීම සඳහා වෙනත් ගැටළු පවතිනවාද යන්න සභාපතිතුමා විසින් කමිටුවෙන් අසන ලදි.

එහිදී ඒ.ඩබ්. ඉන්ද්‍රදාස මහතා කියා සිටියේ පාඨකයන් විසින් ඉල්ලා තිබූ ශබ්දකෝෂය රු. 15000 ක් පමණ වන බවයි.

තීරණය :-
ගරු සභාපතිතුමා කොපමණ මිල අධික වුවත් එය පාඨකයන්ට අවශ්‍යනම් මිලදී ගන්නා ලෙස පවසන ලදි.

තවද හෙප්පුමුල්ල පුස්තකාලයේ තින්ත ගෑම සඳහා අවශ්‍ය ඇස්තමේන්තුවද පුස්තකාලයේ වහලට පිටත වටාද සිවිලිම ගැසීමට ඇස්තමේන්තුවද ලබාගන්නා ලෙස එහි සේවය කරන පුස්තකාල සහායිකාවට ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

කෙරම්ණිය ශාඛා පුස්තකාලයේ කිසිදු අඩුපාඩුවක් නැතිද යන්න වග ගරු ශ්‍රේෂන් කරම්ණියගේ මන්ත්‍රීතුමා විසින් එහි සේවයේ නියුතු පුස්තකාල සහායිකාවගෙන් විමසා සිටින ලදි. එහි අලංකාරය සඳහා මල් පොච්චි කිහිපයක් ලබා දෙන ලෙස පුස්තකාල සහයිකා මිය ඉල්ලා සිටින ලදි.

වෙනත් කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු සභාපතිතුමා ස්තුති කතාව කිරීමට ස්වේච්ඡාවෙන් කමිටුවට පැමිණි ගරු නගරසභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතාට ආරාධනා කරන ලදි.

එහිදී එතුමා එදින ස්වේච්ඡාවෙන් කමිටුවට පැමිණ ඔවුන් සතු දැනුම් සම්භාරය සැමටම ලබාදීම ගැන කමිටු සාමාජිකයන් දෙපළක් වන හර්බට් වීරක්කොඩි මහතාට සහ සිරිපාල මාදුවගේ මහතාට ප්‍රථමයෙන් ස්තුතිය ප්‍රකාශ කරන ලදි. ප්‍රජා සංවර්ධන නිලධාරී මහත්මියටද පුස්තකාලයාධිපතිනය ඇතුළු පුස්තකාල කාර්ය මණ්ඩලයට ස්තුතිය ප්‍රකාශ කරමින් කමිටුවේ වැඩ අවසන් කරන ලදි.

............................
කමිටු ලේකම්
නගර සභාව අම්බලන්ගොඩ.

| | |
|---|---|
| ............................ | ............................ |
| ලේකම් | අත්සන් කළේ සභාපති |
| නගර සභාව අම්බලන්ගොඩ | නගර සභාව අම්බලන්ගොඩ |

**ඒ අනුව 2013 -05-20 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 4** **2013- 04- 30** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව **2013 -04-30** දින පවත්වන ලද සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

ඒ අනුව **2013 -04-30** දින පවත්වන ලද සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**6: 5** **2013- 05- 22** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

## පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව

## 2013.05.22 ප.ව. 2.30

**සහභාගීත්වය**

| | |
|---|---|
| ❖ ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා. | ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ වෛද්‍ය පී.ආර්.එන්.ද සිල්වා මය. | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිල අම්බලන්ගොඩ, |
| ❖ ඕ වී සුනිල් මහතා | ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව. |
| ❖ එච් .එච්. ජයසේන මහතා | ම. සෞ. පරීක්ෂක, අම්බලන්ගොඩ නගර සභාව. |
| ❖ එල්.එච්.බී මංජුල මහතා | ම. සෞ. පරීක්ෂක බරවා රෝග මර්ධන |
| ❖ ඩබ්.එන්.අයි මෙන්ඩිස් මහතා. | ම. සෞ. පරීක්ෂක සෞ.වෛ.නි. කාර්යාලය. |
| ❖ එස්.ඕ නන්දනී මිය. | ප්‍රාදේශීය පරිසර නිලධාරී. |
| ❖ පී. එච්. එල් සී පුෂ්පරාණි මහත්මය. | සංවර්ධන සහකාර, අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ ඩබ්.පී සිල්වා මිය. | ප්‍රජා සං නි., අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ කේ.ශාන්ති මය. | ගොවිජන සංවරධන නිලධාරී. අම්බලන්ගොඩ, |
| ❖ බී. ඕ. ර්. කොඩිතුවක්කු මිය | ප. සෞ. සේ. නිලධාරිනී අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ ඕ.එස්.ර් ගමගේ මිය | ප. සෞ. සේ. නිලධාරිනී අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ පී. කුසුම් ද සිල්වා | කළමණාකරණ සහකාර අම්බලන්ගොඩ නගර සභාව. |
| ❖ එම්.ඩබ් හිරාන් සංජීව මහතා | සෞඛ්‍ය පරිපාලක අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ එම්.එච් පත්මසේන | සෞඛ්‍ය පරිපාලක අම්බලන්ගොඩ නගර සභාව |

**පිළිගැනීම** :- **ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**ග

සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තුමය ඇතුළු සියළු නිලධාරී මහත්ම මහත්මීන් හා අනෙකුත් සියළුම රජයේ නිලධාරීනුත් නගර සභා කාර්‍ය මණ්ඩලයත් ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි. ඉන් අනතුරුව එළඹියේ පසුගිය රැස්වීමේ දී සාකච්ජා වු කරුණු සමාලෝචනයක යෙදීමයි.

**තල්ගස්ගොඩ පොඩි පාලම අසල සිට ලොකු පාලම දක්වා ප්‍රදේශයේ කසල දැමීම.**

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

මේ පිළිබඳව පොලිස් ස්ථානය හා එවන් බින්දුහේවා මහතා දැනුවත් කර ඇති බව විෂය භාර නිලධාරී විසින් පිළිතුරු දෙන ලදි.

**මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ගයන්හි කාණුවල ජලය නිසියාකාරව බැස නොයාම නිසා මදුරුවන් බෝ වන ස්ථාන බවට පත් වී තිබීම.**

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

මේ පිළිබඳව පසුගිය මහා සභාවේ සාකච්ජා කළ බවත් එම මාර්ගවල කාණු සහා අරමුදල් යටතේ අළුත්වැඩියා කිරීමට සභාව තිරණය කළ බවත් පවසන ලදි. මේ සඳහා වැඩ අධිකාරී මගින් අදාළ ඇස්තමේන්තු ලබාගෙන ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකරන ලෙස දන්වන ලදී.

**අදහස් හා යෝජනා**

**2013.06.05 දිනට යෙදෙන ලෝක පරිසර දිනය වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන කමිටුවට ඉදිරිපත් කිරීම.**

**<u>2013.06.05 දිනට යෙදෙන ලෝක පරිසර දිනය නිමිත්තෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන.</u>**

**2013.06.05** පළාත් පාලන අමාත්‍යාංශයේ සම්පත් දායකත්වය ඇතිව කසල කලමණාකරණය හා කොම්පෝස්ට් පොහොර නිපදවීම පිලිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීම හා පළතුරු පැල බෙදාදීම.

හල්වතුර ඇල දෙපස රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

**2013.06.06** හල් වතුර පොඩි ඇල පිරිසිදු කිරීම.

**2013.06.07** නගර සභාවට අයත් සියළුම ගොඩනැගිලි ,(කාර්යාල පරිශ්‍රය හා ඒ අවට) පිරිසිදු කිරීමේ වැඩසටහනක් පැවැත්වීම හා ලෝක පරිසර දිනය වෙනුවෙන් සතිය පුරා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන ඇගයීම.

**2013.06.08** ඩෙංගු රෝග මර්ධන ශ්‍රමදාන වැඩසටහනක් නගර සභා බල ප්‍රදේශය පුරා ක්‍රියාත්මක කිරීම.

**2013.06.10** ලෝක පරිසර දිනය වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන ඇගයීම.

**<u>2013.06.05 දිනට යෙදෙන ලෝක පරිසර දිනය නිමිත්තෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන සඳහා වැය ඇස්තමේන්තුව</u>**

| දිනය | වැඩසටහන | සහභාගීවන පිරිස | වැයවන මුදල | | |
|---|---|---|---|---|---|
| 2013.06.05 | පාසල් ළමුන් දැනුවත් කිරීම. | 350 | රු.50.00 | 350 | රු.17500.00 |
| | පළතුරු පැල ලබා දීම. | 100 | රු.200.00 | 100 | රු.20000.00 |
| 2013.06.06 | හල්වතුර පොඩි ඇල පිරිසිදු කිරීම<br>බැකෝ යන්ත්‍රය | 30 | රු.100.00 | 30 | රු.3000.00<br>රු.20000.00 |
| 2013.06.07 | කාර්යාල පරිශ්‍රය පිරිසිදු කිරීම. | 100 | රු.50.00 | 100 | රු.5000.00 |
| 2013.06.08 | ඩෙංගු රෝග මර්ධන ශ්‍රමදාන වැඩසටහන | 150 | රු.150.00 | 150 | රු.22500.00 |
| එකතුව | | | | | රු.88000.00 |

මේ අනුව ඉහත වැඩසටහන සඳහා වැයවන රු 88000.00 ක වැය ඇස්තමේන්තුව කමිටුව පිළිගත් අතර සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට තිරණය කරන ලදි.

**ප්‍රාදේශීය පරිසර නිලධාරී,එස්.ඩී නන්දනී මිය**

ධර්මාශෝක විද්‍යාලයේ හැර අනෙකුත් පාසල්වල පරිසර නියමු කණ්ඩායම් සිටින බවත් පවසන ලදි.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

පරිසර කමිටුව සඳහා පාසල්වල පරිසර විෂය භාර ගුරු භවතා සහභාගී කරවා ගැනීම සුදුසු බව පෙන්වා දෙන ලදි. ජුනි 05 දින පැවැත්වෙන පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා කලාප අධ්‍යාපන කාර්යාලයේ සහාය ලබා ගන්නා ලෙස පවසන ලදි. දේශණය අවසානයේ දී සිසුන් සඳහා පළතුරු පැල ගොවිජන සංවර්ධන නිලධාරී මගින් ගෙන්වා ගැනීමට තීරණය කරන ලදි. ඒ සඳහා වන වියදම් නගර අලංකරණ ගිණුමෙන් ලබා ගන්නා ලෙස උපදෙස් දෙන ලදි.

කොම්පෝස්ට් පොහොර නිපදවීම හා ගෙවතු වගාවට ජනතාව උනන්දු කරවීම වැඩසටහන සඳහා රිච්දින අරුණැල්ල වැඩසටහන මෙහෙයවන උදය ද සිල්වා මහතාගේ සම්පත් දායකත්වය ලබා ගැනීම තුළින් වැඩි සහභාගිත්වයක් අපේක්ෂා කළ හැකි බව පවසන ලදි.

**ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් එවන ලද 2013.03.01 දිනැති සාර්ථකම මදුරු මර්ධන කටයුතු සිදු කෙරෙන පළාත් පාලන ආයතනය තෝරා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාවට ඉදිරිපත් කිරීම.**

**:ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

ඉහත වැඩසටහන සාර්ථකව සිදු කිරීම සඳහා ගම් මට්ටමින් ඩෙංගු මර්ධන ක්‍රියාකාරී කමිටු පිහිටුවා ශ්‍රමදාන වැඩසටහන් සඳහා ඔවුනගේ දායකත්වය ලබා ගන්නා ලෙස උපදෙස් ලබා දෙන ලදි.

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනී පී.ආර් එන් ද සිල්වා මිය,**

වැසි ජලය ක්‍රමානුකූලව බැස නොයන කාණු පිළිබඳ තොරතුරු ලබා දෙන ලෙස ගාල්ල සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ලිපියක් එවා ඇති බැවින් එම තොරතුරු ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදි.

**: ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතාග**

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී දරු උපත් පිළිබඳ මාසික වාර්තා දැනට ලැබෙනුයේ පෝරඹ හා විලේගොඩ යන කොට්ඨාශ දෙකෙහි පමණක් බැවින් අනෙකුත් කොට්ඨාශවල තොරතුරු ද ලබා දෙන ලෙස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී දැනුවත් කරන ලදි. පාසල්වලට ළමුන් ඇතුළත් කිරීම පිළිබඳ ගැටළුවේ දී එම සංඛ්‍යා ලේඛන අපට වැදගත් වන බව පවසන ලදි.

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනී පී.ආර් එන් ද සිල්වා මිය,**

ඉදිරියේ දී එම තොරතුරු ලබා දීමට කටයුතු කරන බව පවසන ලදි. සෞ.වෛ.නි.කාර්යාලයටත් පළතුරු පැල ලබාදෙන ලෙස ද ඉල්ලීමක් කරන ලදි.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතාග**

පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන වලින් බැහැරලන සිලින්ජර වැනි අපද්‍රව්‍ය කසල සමග මුදාහැරීම තුළින් එම කසල ලබා ගැනීමේ දීසේවක මහතුන් විවිධ අපහසුතාවන්ට මුහුණ දුන් අවස්ථා පවතින බව පෙන්වා දෙන ලදි.

**සෞඛ්‍ය පරිපාලක එම් ඩබ්.හිරාන් සංජීව මහතා**

සුවණ රෝහලින් ඉවත්කරන ලද කසලවල තිබී සිලින්ජර කටුවක් කම්කරුවකුගේ කකලෙහි ඇනීම නිසා ප්‍රතිකාර කළ බව පවසන ලදි.

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනී පී.ආර් එන් ද සිල්වා මිය,**

මේ වනවිට වෛද්‍ය මධ්‍යස්ථානවල දී ම එම අපද්‍රව්‍ය පිළිස්සීම සිදු කරන බව පවසන ලදි.

**නගර සභා ලේකම් ඩී.ව්.සුනිල් මහතා**

ජුනි 08 දින පැවැත්වීමට නියමිත ඩෙංගු මර්ධන වැඩසටහන සඳහා කරන්දෙණිය යුධ හමුදා කඳවුරෙහි නිලධාරීන් ලබා දිය හැකි බව පැවසූ හෙයින් එදින කාණු පිරිසිදු කිරීම සඳහා ගලිය යොදා ගත හැකිද යන්න විමසන ලදි.

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනි පී.ආර් එන් ද සිල්වා මිය,**

එසේ කිරීම තුළින් පරිසරයට විෂබීජ එකතු විය හැකි බව පෙන්වා දෙන ලදි.

**ම.සෞ.ප.එච්.එච්.ජයසේන මහතා.**

එම කාර්ය සිදු කිරීමට පෙර ගලි බවුසරය පිරිසිදු කරන හෙයින් එම තත්වය පාලනය වන බව පවසන ලදි.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

ගලි බවුසර යෙන් පිටවන ජලය අධික පීඩනයකින් යුක්තව බැහැර වන නිසා සියළුම අපද්‍රව්‍ය ඉවත් වී කාණු හොඳින් පිරිසිදු වන බව පවසන ලදී.

ඒ අනුව කාණු පිරිසිදු කිරීම සඳහා ගලිය යොදා ගැනීමට කමිටුව තීරණය කරන ලදී

ගලි බවුසරය සඳහා ස්ථිර රියදුරකු යොදවා වැසිකිළි පවිත්‍ර කිරීමේ කටයුතු සිදු නොවන අවස්ථාවලදී කාණු පිරිසිදු කිරීම සඳහා යොදා ගන්නා ලෙස සභාපතිතුමා ම.සෞ.ප. වෙත උපදෙස් දෙන ලදි.

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනි පී.ආර් එන් ද සිල්වා මිය,**

ධූමියන කටයුතු සඳහා අවශ්‍ය උපකරණ සහ ආරක්ෂක ඇදුම් කට්ටල 06ක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි.

එම උපකරණ හා ඇදුම් කට්ටල ලබා දෙන ලෙස සභාපති තුමා උපදෙස් දෙන ලදි. නගර සභා සේවකයන් ද පුහුණු කරන ලෙසත් ඉහත ඇදුම් හා උපකරණ කට්ටල ඔවුන්ට ද ලබා දෙන ලෙසත්, උපදෙස් දෙන ලදි.

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනි පී.ආර් එන් ද සිල්වා මිය,**

සෞ.වෛ.නි.කාර්යාලයේ භාවිතා කරන රූපවාහිනිය දැනට තබා ඇත්තේ ටොලියක් උඩ බවත්,එය තැබීම සඳහා රූපවාහිනී රැඳවුමක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

කර්මාන්ත අංශයේ ඇති වානේ බට යොදා ගෙන නගර සභා පැස්සුම්කරු ලවා එම කාර්‍ය ඉටු කරවා දෙන ලෙස ලේකම් මහතාට උපදෙස් දෙන ලදි.

**ම. සෞ. පරීක්ෂක බරවා රෝග මර්ධන එල්.එච්.බී මංජුල මහතා**

ධූමායන කටයුතුවලදී භාවිතා කරන උපකරණ දමා ගැනීම සඳහා ස්ථානයක් ලබා දෙන ලෙස පැවසීය.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතාග**

ඒ සඳහා පැරණි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලෙහි කාමරයක් ලබා දෙන ලෙස දන්වන ලදි.

**ස්තුති කතාව.**

**සංවර්ධන සහකාර ඩබ්.පී සිල්වා මිය.**

නගරයේ දියුණුව වෙනුවෙන් පැවැත්වෙන පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුවේ අද දින රැස්වීම සඳහා පැමිණි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනි පී.ආර් එන් ද සිල්වා මියටත්,අනෙකුත් රජයේ නිලධාරීන් සියළු දෙනාටත් ස්තුතිය පුද කරන බව ප්‍රකාශ කරන ලදි.

ප.ව.4.15 ට පමණ රැස්වීමේ කටයුතු නිම කරන ලදි.

සකස් කළේ :

පී.එච්.එල්.සී පුෂ්පරාණි.　　　　　　　　ලේකම්

අම්බලන්ගොඩ නගර සභාව

**2013.06.05 දිනට යෙදෙන ලෝක පරිසර දිනය නිමිත්තෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන.**

**2013.06.05** පළාත් පාලන අමාත්‍යාංශයේ සම්පත් දායකත්වය ඇතිව ආහාර නාස්තිය අවම කිරීම හා ආහාර සුරක්ෂිතතාව පිලිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීම හා පළතුරු පැල බෙදාදීම.

හල්වතුර ඇල දෙපස රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

**2013.06.06** හල් වතුර පොඩි ඇල පිරිසිදු කිරීම.

**2013.06.07** නගර සභාවට අයත් සියළුම ගොඩනැගිලි ,(කාර්යාල පරිශ්‍රය හා ඒ අවට) පිරිසිදු කිරීමේ වැඩසටහනක් පැවැත්වීම හා ලෝක පරිසර දිනය වෙනුවෙන් සතිය පුරා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන ඇගයීම.

**2013.06.08** ඩෙංගු රෝග මර්ධන ශ්‍රමදාන වැඩසටහනක් නගර සභා බල ප්‍රදේශය පුරා ක්‍රියාත්මක කිරීම.

**2013.06.10** ලෝක පරිසර දිනය වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන ඇගයීම.

**2013.06.05 දිනට යෙදෙන ලෝක පරිසර දිනය නිමිත්තෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන සඳහා වැය ඇස්තමේන්තුව**

| දිනය | වැඩසටහන | සහභාගීවන පිරිස | වැයවන මුදල | | |
|---|---|---|---|---|---|
| 2013.06.05 | පාසල් ළමුන් දැනුවත් කිරීම. | 350 | රු.35.00 | 350 | රු.12250.00 |
| | පළතුරු පැල ලබා දීම. | 100 | රු.200.00 | 100 | රු.20000.00 |
| 2013.06.06 | හල්වතුර පොඩි ඇල පිරිසිදු කිරීම සංග්‍රහ වියදම්<br>බැකෝ යන්ත්‍රය | 30 | රු.100.00 | 30 | රු. 3000.00<br>රු.20000.00 |
| 2013.06.07 | කාර්යාල පරිශ්‍රය පිරිසිදු කිරීම. | 100 | රු.50.00 | 100 | රු.5000.00 |
| 2013.06.08 | ඩෙංගු රෝග මර්ධන ශ්‍රමදාන වැඩසටහන<br>දිවා ආහාර<br>තේ | 350<br>350 | රු.140.00<br>රු .35.00 | 350<br>350 | රු.49000.00<br>රු .12250.00 |
| එකතුව | | | | | රු.121500.00 |

**ඒ අනුව 2013 -05- 22 දින පවත්වන ලද සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 6** **2013- 04- 29** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ජ්. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>**අම්බලන්ගොඩ නගර සභාව - ක්‍රීඩා කමිටු රැස්වීම**</u>

දිනය - **2013.04.29**

ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව

වේලාව - ප.ව.2.30

<u>**සහභාගීත්වය**</u>

පී.සරත් ශ්‍රීහ ලාල් මයා - ගරු නගර සභා මන්ත්‍රීN , අම්බලන්ගොඩ නගර සභාව

ආර්.පී. දේව් රෝහාන් මයා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව

ඩී.වී.සුනිල් මයා - ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව.

සුගත් හෙට්ටිආරච්චි මයා - ක්‍රී ඩා කමිටු සාමාජික

ඇම්.ඩබ්.කේෂාන් ප්‍රෝහාත් මයා - .

සුනිල් ජයසිරි මයා - .

කේ.ටී.ආර්.සුමනසිරි මයා - ඩොල්ෆින් ක්‍රිනඩා සමාජය

කේ.පී.තාබ්රේ ව් මයා - රියෝ ක්‍රිබඩා සමාජය

එච්.යසරත්න ද සිල්වා මයා - ක්‍රි-ඩා භූමිභාරකරු

දසන් නයින්දුවාවඩු මයා -සිංහ ක්‍රිමඩා සමාජය

ඩබ්.ඒ.ආර්.ගුරුසිංහ මයා - ක්‍රී ඩා ආචාර්ය, ධර්මාශෝක විද්‍යානලය

එන්.එච්.විරාජ් චමින්ද මයා - ක්‍රීකඩා ආචාර්ය, ධර්මාශෝක විද්‍යාදලය

ඩබ්.පී.සිල්වා මිය - සංවර්ධන සහකාර ( ප්‍රාජා සංවර්ධන නිලධාරී - වැ.බ)

කිරි.ීඩා කමිටුව සඳහා කිරා ීඩා සමාජ නියෝජනය කරමින් පැමිණි නිලධාරීන් ,ක්‍රි-ඩා කමිටු සාමාජික මහතුන් පිළිගැනීම ගරු දෙව් රොහාන් මන්ත්‍රීව තුමා විසින් සිදුකරන ලදි.
ගරු ලේකම්තුමා සභාව මෙහෙයවීම සිදු කළ අතර න්‍යානයපත්‍රජනුකූලව ප්‍රිථමයෙන්ම පසුගිය ක්‍රීඩා කමිටු රැස්වීමේ කරුණු සමාලෝචනය කිරීම සිදු කරන ලදි.

**එම්.ඩබ්.සිසිර කුමාර මහතා**

ක්‍රිවඩා පිටියේ වහළ වෙනස් කිරීම තාක්ෂතණික ක්‍රියා පිළිවෙල අනුව ප්‍රා යෝගික නොවන බවත් සුදුසුම ස්ථානයේ එය ස්ථාපිත කර ඇති බවත් ,ක්‍රීඩා මණ්ඩපයේ ඇති ඉහලම ආසනයේ සිට ක්‍රීඩා පිටිය හොදින් දිස් වන බවත් තමා එය නිරික්ෂඇණය කළ බවද ප්‍රකකාශ කරන ලදි. තවද වහල වෙනස් කිරීම හේතුවෙන් වර්ෂා අවස්ථාවේදී වැසි ජලය ක්‍රීඩා මණ්ඩපය තුලට පතිත වන බවත් තව දුරටත් ප්‍ර කාශ කර සිටින ලදි.**Changing room** එක ඉදි කිරීමට යෝජිත ස්ථානය ගරු සභාපති තුමා අද දින ( 29 දා ) නිරික්ෂnණය කළ බවත් 30දා, එනම් හෙට සිට වඅඩ ආරම්භ කිරීමට කොන්ත්‍රා ත් කරු සමඟ සාකච්ඡා කරන ලද බවත් ප්‍රකාශ කර සිටින ලදි.

**එම්.ඩබ්. කේෂාන් ප්‍ර සාද් මයා**

අම්බලන්ගොඩ කි.මී.5 පිහිනුම් තරගාවලිය පිළිබඳ අදහස් දක්වමින් එම තරඟය අම්බලන්ගොඩ ගාගේ පැවැත්වීමට අදහස් කරන බවත් එය සංවිධානය කර තරඟ පැවැත්වෙන දින ප්‍රදකාශ කරන බවත් කියා සිටින ලදි. එම තරඟයට පෙර **Changing room** එකේ වැඩ අවසන් කර දෙන ලෙසට ඉල්ලීමක් කරන ලදි.

අදහස් හා යෝජනා

**එම්.ඩබ්. කේෂාන් ප්‍රnසාද් මයා**

පෝය සීමාව අසල වෙරළ තීරයේ පරිසරයට හානිවන අයුරින් නොයෙකුත් අකටයුතුකම් සිදුවන බව ප්‍රසකාශ කළ අතර එම පරිසරය ආරක්ෂාව කර ගැනීමේ අවශ්‍යතතාවය පෙන්වා දෙන ලදි. එයට විසඳුමක් වශයෙන් එයට ඇතුළ වන ස්ථානයට ගේට්ටුවක් සවිකර දෙන ලෙසට ඉල්ලීමක් කරන ලදි.

ඩබ්ලිව්.ඒ.ජී.ගුරුසිංහ මයා

කලාප ක්‍රිවඩා තරඟ මැයි මස 02 දා සිට ආරම්භ වන බවත් පිටිය තරඟ මැයි 06 දා සිට ආරම්භ වන බැවින් එයට පෙර ක්‍රිාඩාංගනයේ ධාවන පථය සළකුණු කර දෙන ලෙසත් ඉල්ලා සිටින ලදි.

**එච්.යසරත්න ද සිල්වා මහතා**

ධාවන පථය මැනීමේ කටයුතු නගර සභාවේ මිනුම් වැඩ අධිකාරිය මඟින් කළ හැකි බව සඳහන් කරන ලදි.

**ඩබ්ලිව්.ඒ.ජී.ගුරුසිංහ මයා**

ධාවන පථය පථය වටේට පොළව යට (අඟල් 6 ක් යටින් ) කුඩා කොන්ක්‍රි6ට් කණු වලින් සීමාව ලකුණු කර දෙන ලෙස ද ඉල්ලා සිටින ලදි.

**ගරු සරත් ශ්‍රීල ලාල් මන්ත්‍රීනතුමා**

ඒ සඳහා මිල ගණන් කැඳවා මිනුම් කරුවෙකු ලවා එය සිදු කරන ලෙස දන්වා සිටින ලදි.

**ඩබ්ලිව්.ඒ.ජී.ගුරුසිංහ මයා**

දුර පැනීමේ ස්ථානය සකස් කර ඇති බවත් එම ස්ථානය අසල පොළවේ තවත් උස් තැන් ඇති බැවින් එම ස්ථාන ද නිසි පරිදි සකස් කර දෙන ලෙස ද ඉල්ලා සිටින ලදි.

**එන්.එච්.විරාජ් චමින්ද මයා**

නගර සභා ක්‍රිඑඩා පිටිය අසල ඇති වතුර ටැප් එක ධර්මාශෝක විද්‍යානලීය සැණකෙළියෙන් පසු ඉවත් කර ඇති බව කියා සිටින ලදි. ඒ හේතුවෙන් ක්‍රි ඩක ක්‍රීයඩිකාවන් මහත් අසීරුතාවයකට පත් වී ඇති බවත් ඔවුන්ට බීමට ඇත්තේ රියෝ ක්‍රී ඩා සමාජයෙන් හා සිංහ ක්‍රී්ඩා සමාජයෙන් ලබා දෙන වතුර බෝතල් පමණක් බවද කියා සිටින ලදි. එය හොඳ තත්වයක් නොවන බැවින් සභාපති තුමාටද එය ප්‍රාශ්ණයක් විය හැකි බවත් තව දුරටත් ප්‍රිකාශ කරන ලදි.

ඉන් අනතුරුව එම ටැප් එක ඉවත් කිරිම පිළිබඳ විමසීම සඳහා ආරක්ෂටක අංශයේ නිලධාරියෙකු ලේකම් තුමා විසින් කැඳවන ලදි. එහිදී එම ආරක්ෂරක නිලධාරියා ප්‍රයකාශ කර සිටියේ සැණකෙළිය පැවැත්වූ දින වලදී වරින් වර ටැප් තුනක් සවි කළ බවත් එම ටැප් සියල්ලම කඩා රගෙන ගොස් ඇති බව කියා සිටින ලදි. නැවත ටැප් එකක් සවි කරන ලෙස ලේකම් තුමා විසින් එම නිලධාරියාට උපදෙස් දෙන ලදි.

**එන්.එච්.විරාජ් චමින්ද මයා**

කලාප ක්‍රි ඩා තරඟ වලට පෙර ක්‍රිනඩා පිටියේ තැන තැන ඇති පස් ඉවත් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

**එච්.යසරත්න ද සිල්වා මහතා**

30 දා වන විට එම පස් ඉවත්කර ක්‍රිඩා පිටිය සකස් කර දෙන බව ප්‍රකකාශ කරනලදි.

**කේ.ටී.ආර්.සුමනසිරි මයා**

නගර සභා ක්‍රිටඩා පිටිය වැසි දිනවලදී මඩ වගුරක් වන බවත් ඒ සඳහා පිළියමක් යොදන ලෙසටත් ඉල්ලා සිටින ලදි.

**ගරු දෙව් රොහාන් මන්ත්‍රීා තුමා**

ඒ සඳහා සකස් කර ඇති ව්‍යාාපෘති වාර්තාව අනුව රුපියල් ලක්ෂව 300 ක් පමණ වැය වන බව ප්‍ර කාශ කරන ලදි.

තාක්ෂදණික නිලධාරීන්ගේ උපදෙස් අනුව පිටිය සකස් කර ඇති බවත් කෙසේ සකස් කලත් පිටිය සුපිරි ක්‍රීැඩා පිටියක් ලෙස සකස් කල නොහැකි බවත් ප්‍ර කාශ කරන ලදි.

**කේ.ටී.ආර්.සුමනසිරි මයා**

මැයි මස 04 දින ජනාධිපත තුමා ධර්මාශෝක විද්‍යාතලයට පැමිණීමට නියමිත බැවින් ප්‍රදේශයේ ප්‍රටධාන පාසල් වල සිසු සිසුවියනන්ගේ අත්සනින් ක්‍රි ඩා පිටිය සකස් කර දෙන ලෙස ඉල්ලීමක් කරන ලෙසත් මේ පිළිබඳව ක්‍රිීඩා ඇමතිතුමා දැනුවත් කරන ලෙසත් ඉල්ලා සිටින ලදි.

**ගරු සරත් ශ්‍රිර ලාල් මන්ත්‍රීැතුමා**

ඒ පිළිබඳව ක්‍රි ඩා සමිති සියල්ලෙහිම සාමාජිකයින්ගේ අත්සනින් ඉල්ලීමක් කරන බව ප්‍රිකාශ කරන ලදි.

වහළ සකස් කිරීමට වැය වන මුදලින් ළමයින්ට ක්‍රිේඩා කිරීමට ඇති තිබෙන පිටියේ කාණු පද්ධතිය සකස් කර ක්‍රිීඩා පිටිය ප්‍රිතිසංස් කරණය කිරීම වඩා යෝග්යන බවත් , වෙනත් ව්‍යාරපෘතියකින් වහළ සකස් කිරීමට ඉදිරියේදී ක්‍රි යා කිරීමට හැකි බවත් ප්‍රමකාශ කරන ලදි.

**එම්.ඩබ්.සිසිර කුමාර මහතා**

ක්‍රිීඩා භූමිය සකස් කිරීමට පෙර වටේ සැලැස්ම සකස් කළ යුතු බව කියා සිටි අතර කොළඹින් පැමිණි නිලධාරීන් නිරීක්ෂහණයට අනුව ක්‍රිවඩා පිටියේ අඩි 3 ක් පමණ පස් ඉවත් කර නැවත සකස් කළහොත් එය හොඳ මට්ටමකට ගත හැකි බව ප්‍රසකාශ කර සිටි බවත් කියා සිටින ලදි.

**ගරු සරත් ශ්‍රීක ලාල් මන්ත්‍රීශතුමා**

මේ සියළු දෙයින්ම බලාපොරොත්තු වන්නේ නගරයේ දරුවන්ගේ ක්‍රි ඩා කටයුතු සාර්ථක කර ගැනීමට බවත්, ඒ සඳහා නාගරික මන්ත්‍රීෝ වරුන්ගේ විරුද්ධත්වයක් නොමැති බවත් ප්‍රුකාශ කරන ලදි.

ඉන් අනතුරුව පැමිණ සිටි සියළුම මහත්ම මහත්මීන්ට ස්තුතිය පල කරමින් කමිටුවේ කටයුතු අවසන් කරන ලදි.

සකස් කළේ - ඩබ්ලිව් .පී.සිල්වා මිය

සංවර්ධන සහකාර /ප්‍රජා සංවර්ධන නිලධාරී ( වැ.බ.)

ලේකම්,

අම්බලන්ගොඩ නගර සභාව

ඒ අනුව 2013 -04- 29 දින පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**6: 7** **2013- 05- 28** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>**අම්බලන්ගොඩ නගර සභාව - ක්‍රීඩා කමිටු රැස්වීම**</u>

දිනය - **2013.05.28**

ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව

වේලාව - ප.ව. 2.30

<u>**සහභාගීත්වය**</u>

ඇම්.ඩබ්.අරුණ ප්ර2දීප් මහතා - ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව

එච්.එල්. අනුර කිත්සිරි මහතා - ගරු නගර සභා මන්ත්රී , අම්බලන්ගොඩ නගර සභාව

කේ.ටී.ආර්.සුමනසූරිය මහතා - ඩොල්ෆින් ක්රිගඩා සමාජය

සුගත් හෙට්ටිආරච්චි මහතා - ක්රීයඩා කමිටු සාමාජික .

එස්.කේ.පත්මසිරි මහතා - ක්රීඩා කමිටු සාමාජික .

මහේන්ද්ර. වික්ර මසිංහ මහතා - ක්රීරඩා කමිටු සාමාජික .

එම්.ඩබ්.ශර්ලි චන්ද්රංසිරි මහතා - ක්රී ඩා කමිටු සාමාජික .

එම්.එම්.ජයරත්න මහතා - රියෝ ක්රිාඩා සමාජය

කේ.පී.තාබ්රේ ව් මහතා - සොනෙල් ක්රිජඩා සමාජය

ඩබ්.ඒ.ආර්.ගුරුසිංහ මයා - ක්රීලඩා ආචාර්ය, ධර්මාශෝක විද්යාාලය

එච්.යසරත්න ද සිල්වා මයා - ක්රි-ඩා භූමිභාරකරු

එම්.ඩබ්.සිසිර කුමාර මහතා - වැඩ අධිකාරී

ඉඳුනිල් එදිරි වික්රදමසූරිය මහතා - පාපන්දු පුහුණු කරු,

එච්.ජී.දිලිනි චතුරිකා මිය - කළමණාකරන සහකාර

ඩබ්.පී.සිල්වා මිය - සංවර්ධන සහකාර (ජරක.සං. නිලධාරී වැ.බ)

**පිළිගැනීම - ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්රපදීප් මහතා.**

කිරිගැඩා කමිටුව සඳහා කිරම-යඩා සමාජ, පාසල් නියෝජනය කරමින් පැමිණි නිලධාරීන්, ක්රිබඩා කමිටු සාමාජික මහතු හා නගර සභා කාර්ය මණ්ඩලය ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව ජර කාශ කරන ලදි. ඉන් අනතුරුව න්යානයපත්රණනුකූලව ජර්ථමයෙන්ම පසුගිය ක්රිරඩා කමිටු රැස්වීමේ කරුණු සමාලෝචනය කිරීම සිදු කරන ලදි.

**ගරු සභාපතිතුමා**

- නගර සභා ක්‍රීඩාංගනයේ ධාවන පථය සලකුණු කිරීම හා ධාවන පථය වටේට අඟල් 06 ක් යටින් කුඩා කොන්ක්‍රීසට් කණු වලින් සීමාව ලකුණු කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම.

<u>තීරණය</u>

**මිනින්දොරු වාර්තාවක් ලබා ගෙන මිල ගණන් කැඳවීමට හා එය ඊලඟ සභා වාරයට ඉදිරිපත් කරන ලෙස දැන්වීම .**

- අම්බලන්ගොඩ කි.මී.05 නමින් පවත්වන ජාතික මට්ටමේ පිහිනුම් තරඟාවලිය පිළිබඳ අදහස් විමසීම

**එස්.කේ.පත්මසිරි මහතා**

ඔක්තෝම්බර් මාසය වන විට දිනයක් ප්‍රමකාශ කල හැකි බව සඳහන් කරන ලදි.එම තරඟ පවත්වන දිනයට පෙර CHANGING ROOM එකේ වැඩ අවසන් කර දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි. එමෙන්ම CHANGING ROOM එකට හොඳ වාතාශ්‍ර යක් ලැබෙන අයුරින් සුළං කවුළු 02 සහිතව සකසා දෙන ලෙසට ඉල්ලීමක් කරන ලදි.

එම අවස්ථාවේදී ඒ පිළිබඳව විමසීම සඳහා ගරු සභාපතිතුමා විසින් වැඩ අධිකාරී **එම්.ඩබ්** සිසිර කුමාර මහතා කමිටුව වෙත කැඳවන ලදි.

**එම්.ඩබ්.සිසිර කුමාර මහතා**

CHANGING ROOM සුළං කවුළු සහිතව සැකසීමට නියමිත බව පවසා සිටි අතර එය ඉදිරියේදී සදා නිම කිරීමට කටයුතු යොදා ඇති බවද ප්‍රවකාශ කරන ලදි

**ගරු සභාපතිතුමා**

CHANGING ROOM එකේ ස්ලැබ් එක දැමීමේ දී එය නියම ප්‍රසමිතියට අනුවම තිබිය යුතු බවත් වහලක් නොවිය යුතු බවත් දන්වන ලදි.

- පෝය සීමාව අසල වෙරළ තීරයේ පරිසරයට අහිතකර ලෙස සිදුවන අකටයුතුකම් සඳහා විසඳුමක් ලෙස ඇතුල්වන ස්ථානයට ගේට්ටුවක් සවි කිරීම

<u>තීරණය</u>

ගලවා ඉවත් කරන ලද ගේට්ටුවක් අළුත් වැඩියා කර එම ස්ථානයේ සවි කරන ලෙසට කර්මාන්ත අංශය දැනුවත් කිරීමට උපදෙස් දෙන ලදි.

**ගරු සභාපතිතුමා**

ක්‍රිසඩා පිටියේ තැන තැන පස් ගොඩ ගසා තිබීම පිළිබඳ යසරත්න මහතාගෙන් කරුණු විමසා සිටින ලදි.

**එච්.යසරත්න ද සිල්වා මහතා**

**ධර්මාශෝක විද්‍යාාලය විසින් එහි අළුත්වැඩියා කටයුතු නිම කර දී නොමැති බව පවසන ලදි.**

ගරු සභාපතිතුමා

යසරත්න මහතා හා අශෝක මහතා විසින් ඒ පිළිබඳ සොයා බලා ක්‍රීනඩා පිටිය පිළිසකර කිරීමේ කටයුතු ඉක්මනින් අවසන් කළ යුතු බව දන්වන ලදි.

**එච්.යසරත්න ද සිල්වා මහතා**

**අශෝක මහතා ඒ පිළිබඳ කටයුතු සිදු කළ යුතු බවත් එය සිදු නොකරන බවත් ප්‍රිකාශ කර සිටින ලදි.**

**ගරු සභාපතිතුමා**

<u>**තීරණය**</u>

ඒ පිළිබඳව යසරත්න මහතාගෙන් ප්‍රැකාශයක් ලබා ගන්නා ලෙසත්,ඒ අනුව අශෝක මහතාගෙන් ක්‍රී ඩා පිටිය පිළිසකර නොකිරීම පිළිබඳ කරුණු විමසන ලෙසත් දන්වන ලදි. තවද ක්‍රීශඩා පිටිය පිළිසකර කිරීමේ කටයුතු

අවසන් කර නොදෙන්නේ නම් ධර්මාශෝක විද්‍යාලයේ ඇප මුදල් නිදහස් කර නොදිය යුතු බව ප්‍රකාශ කරන ලදි. එම ඇප මුදල් නිදහස් කිරීම පිළිබඳ කවුරුන් හෝ විමසීම් කළ අවස්ථාවක එය සභාවට ඉදිරිපත් කරන ලෙස විෂය භාර නිලධාරිනිය දැනුවත් කරන ලදි.

තවද පිළිසකර කටයුතු අවසන් කර භාර දෙන තුරු, සභාවට ලැබෙන සියළුම ක්‍රීඩා පිටිය වෙන් කිරීමේ අවස්ථා ලබා දීමට නොහැකි වීම හේතුවෙන් නගර සභාවට වන පාඩුව ධර්මාශෝක විද්‍යාලයේ ඇපමුදලින් අය කර ගන්නා ලෙස ප්‍රධාන ආදායම් නිලධාරිනිය දැනුවත් කරන ලෙසද දන්වන ලදි.

**කේ.පී.තාබ්රේව් මහතා**

රියෝ ක්‍රීඩා සමාජයේ සරා ක්‍රිකට් තරගා වලිය සඳහා ක්‍රීඩා පිටිය වෙන් කර ගැනිමට නොහැකි වීම හේතුවෙන් එම තරග සියල්ලම පිට පළාත් වලදී පැවැත්වීට සිදුවූ බව පවසන ලදි. එනම් ඉන් තරග දෙකක් රත්ගම ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනයේදීද , එක් තරගයත් දෙඹර වැව මහා විද්‍යා ලීය ක්‍රීඩාංගනයේදී ද පැවැත්වීමට සිදු වූ බව ප්‍රකාශ කරන ලදි. ඒ සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවූ බව ද පවසන ලදි.

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා**

කලාප ක්‍රීඩා තරඟද පැවැත්වීමට සුදුසු පසු බිමක් නොමැති වීම හේතුවෙන් එම තරගද නගරයෙන් පිට ස්ථාන වල පැවැත්වීමට සිදු වූ බව කියා සිටි අතර , ධර්මාශෝක විද්‍යාලය සමග සුහදව කථා කර මෙය ඉක්මනින් පිළිසකර කර ගනිමු යැයි පවසන ලදි.

**අදහස් හා යෝජනා**

**ගරු සභාපතිතුමා**

පසු ගිය වසරේ මෙන්ම මෙම වසරේදී ද නගර ක්‍රීඩා උළෙල හා ලෝක ළමා දින උත්සවය පැවැත්වීමට අදහස් කරන බව දන්වන ලදි.

ඉදිරියේදී පැවැත්වෙන ක්‍රීඩා කමිටු සඳහා නගරයේ පිහිටි පාසල් 5 හි විදුහල්පති වරුන් ද කැඳවන ලෙස දන්වන ලදි.

**ඩබ්ලිව්.ඒ.ජී.ගුරුසිංහ මයා**

පළාත් ක්‍රීඩා තරගාවලියට පෙර නගර ක්‍රීඩා උළෙල පවත්වීම සුදුසු බව යෝජනා කරන ලදි.

**ගරු සභාපතිතුමා**

එය සැප්තැම්බර් මාසය පමණ වන විට පැවැත්වීට සුදුසු බව දන්වන ලදි.

එමෙන්ම මෙම තරග පැවැත්වීම නිසා කුඩා පාසල් වල සිටින දක්ෂද දරුවන්ගේ සැඟවී ඇති ක්‍රීඩා දක්ෂ තා හඳුනාගෙන ඔවුන් ඉදිරියට රැගෙන ඒමට හැකිවීමෙන් ජයග්‍රහණ ලබා ගත හැකි බව පවසන ලදි. ගියවර පැවැත්වූ තරඟාවලිය නිසා තම පාසල් දරුවන්ගේ බිය සැක නැතිවී සුපිරි පාසල් සමග තරඟ කිරීමට අවස්ථාව ලැබීම නිසා ජයග්‍ර හන ලබා ගැනීමට තම පාසලට හැකිවූ බව කරන්දෙණිය මධ්‍යස මහා විද්‍යාවලයේ ගුරු භවතෙකු තමන්ට පැවසූ බවත් ඒ පිළිබඳ ස්තුතිය පල කළ බවත් පවසන ලදි.

- 2013 නගර ක්‍රීඩා උළෙල සඳහා වියදම් ඇස්තමේන්තුව හා 2013 ලෝක ළමා දින උත්සවය සඳහා ඇස්තමේන්තුව ඊළඟ සභාවට ඉදිරිපත් කරන ලෙස හා පූර්ව අනුමැතිය සඳහා යැවීමට කටයුතු කරන ලෙස විෂය භාර නිලධාරියා ට දන්වන ලදි.

**තීරණය**

**නගර ක්‍රීඩා විනිශ්චය කටයුතු සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් විය යුතු බවත්**

**ලෝක ළමා දිනය සඳහා අනුග්‍රාහක භවතුන් මාර්ගයෙන් ආධාර ලබා ගැනීමට අපේක්ෂාවු කරන බවත් දන්වන ලදි.**

**එස්.කේ.පත්මසිරි මහතා**

මාදම්පා ගග අවට භූමියේ පවිත්‍රසතාවය ගැන තවදුරටත් සැලසිලි මත් විය යුතු බවත්, පවතින කසළ ඉවත් කළත් භූමිය පිස දැමීමේ කටයුතු නිසි පරිදි සිදු නොකරන බවත් එය ඉටු කර දෙන ලෙසත් ඉල්ලා සිටින ලදි.

**ගරු සභාපතිතුමා**

**තීරණය**

**එය නගර සභාව සතු භූමියක් බැවින් එහි පවිත්‍රිතාවය රැකිය යුතු බවත්ජ් ගැන සොයා බලා කටයුතු කරන ලෙසට මහජන සෞඛ්‍ය පරීක්ෂනක ට ලිඛිතව දැනුවත් කිරීම.**

වෙනත් අදහස් හා යොජනා විමසීම

මහේන්ද්‍ර වික්‍රරමසිංහ මහතා

ක්‍රීඩා පිටියේ ක්‍රිකට් ක්‍රීඩා පුහුණු වීම් කටයුතු සවස් වන තුරු සිදු කරන බැවත් පාපන්දු ක්‍රිතඩකයින් සඳහා පුහුණු අවස්ථාව ලබා ගැනීමේ අවහිරතා පවතින බවත් ඒ සඳහා විසඳුමක් ලබා දෙන ලෙසත් ඉල්ලීම. තවද පිටිය වටා ලයිට් කණු 4 ක් සිටුවා ආලෝකය ලබා දෙන්නේ නම් එම අපහසුතාවය මග හරවා ගත හැකි බවද පවසන ලදි.

**ගරු සභාපතිතුමා**

ක්‍රීඩා පිටිය සඳහා සිසිර මහතා විසින් කලින් ඉදිරිපත් කරන ලද ලක්ෂය 300 ක ඇස්තමේන්තුව ක්‍රියාත්මක කල නොහැකි බවත්, ඒ සඳහා නව ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස දන්වන ලදි.

සවස 5.30 පසු රාත්‍රීන 8.00 පමණ වන තුරු ක්‍රීඩා කිරීමට හැකි වන අයුරින් එල්.ඊ.ඩී වොට් 500 හි විදුලි පහන් සවි කිරීමේ හැකියාව පිළිබඳ විමසන ලදි .

**එම්.ඩබ්.සිසිර කුමාර මහතා**

ක්‍රීඩා පිටිය සඳහා එල්.ඊ.ඩී වොට් 500 විදුලි පහන් නිර්දේශ කළ නොහැකි බව පවසන ලදි.

තවද ක්‍රීඩා කමිටුවේ ඉල්ලීම පරිදි හෙලජන්ට් විදුලි ලාම්පු 04 ක් සවි කර දිය හැකි බව පවසන ලදි.

**තිරණය**

**හෙලජන්ට් ලාම්පු 04 ක් සවි කර දෙන ලෙසට ඉල්ලීමක් කර. එය ඉටු කරවා ගැනීම**

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා**

පැරල් බාර් එකේ සවිකර ඇති ස්ථානයේ පොළව පස් දමා සකස් කර දෙන ලෙසට ඉල්ලීම

**ගරු සභාපතිතුමා**

එම ස්ථානයට මුහුදු වැලි ඇතිරිම හෝ එසේ නැතිනම් රබර් ස්පොන්ජ් එකක් සවි කිරීම සුදුසු බව පවසන ලදි.

**තිරණය**

**රබර් ස්පොන්ජ් එකක් සවි කිරීම සඳහා ඇස්තමේන්තුවක් ලබා දෙන ලෙස දැන්වීම.**

කේ.පී.තාබ්රේව් මහතා

ක්‍රීඩා පිටිය අවට සැරිසරන ගව ගාලේ සිටින ගවයන් දෙදෙනෙකු සභාව හා ග්‍රී න් ගේට්ටුව අතර ඉඩ ඇති ස්ථානයෙන් ක්‍රීඩා පිටියට ඇතුල් වී පොළව හාරන බවත් එයට විසඳුමක් ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදි.

**එච්.යසරත්න ද සිල්වා මහතා**

**සම්පූර්ණයෙන්ම වැට ගැසීම සුදුසු බව පවසන ලදි.**

ගරු සභාපතිතුමා

ග්‍රීසන් නෙට් එක ගැසීම සුදුසු බව දන්වන ලදි .

<u>තීරණය</u>

**ග්‍රී න් නෙට් එක සවි කිරීම සඳහා ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන ලෙස දන්වීම**

ගරු නගර සභා මන්ත්‍රීට අනුර කිත්සිරි මහතා

නගරයේ දූ දරුවන්ගේ ක්‍රී්ඩා දක්ෂරතා ඉහල නැංවීම සඳහා කැපවීමෙන් ක්‍රිසයා කරන ක්‍රි්ඩා සමාජ නියෝජනය කරමින් සපැමිණි නිලධාරින්, පාසල් නියෝජනය කරමින් පැමිණි ක්‍රිරඩා භාර නිලධාරීන් , හා නගර සභාවේ නිලධාරීන් ඇතුළු පැමිණ සිටි සියළුම මහත්ම මහත්මීන්ට ස්තුතිය පල කරමින් කමිටුවේ කටයුතු අවසන් කරන ලදි.

සකස් කළේ - ඩබ්ලිව් .පී.සිල්වා මිය

සංවර්ධන සහකාර /ප්‍රජා සංවර්ධන නිලධාරී ( වැ.බ.)

ලේකම්,

අම්බලන්ගොඩ නගර සභාව

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේ වාර්තාවෙ ධර්මාශෝක විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සම්බන්ධයෙන් ඇප මුදල් නිදහස් කිරීම පිළිබඳව සඳහන් කරල තියෙනවා. මේ අරගෙන තියෙන තීන්දුව හරිම අසාධාරණ තීන්දුවක්. මොකද ධර්මශෝක විද්‍යාලය කියපු විදියටම ක්‍රීඩාපිටිය පිළිසකර කර දුන්නා. අයහපත් කාලගුණයත් එක්ක විටින් විට දරුවන් ක්‍රීඩා කරනව හරක් ඇවිල්ල හවසට ඔලුවෙන් ගලවනව නිලධාරීන් කවුරුත් අධීක්ෂණයට නෑ. නමුත් අපි නිලධාරීන් කියපු විදියට මාස තුනක් තිස්සෙ කටයුතු කරල තියෙනව. මේක අවුරුදු දෙකක ව්‍යාපෘතියක් විදියට යන්න බෑ. ඇප තැන්පත් කරල තියෙන්නෙ පිට්ටනිය තිබුන විදියට හදල දෙන්න. මේ වන විට තිබුණටත් වඩා හොදට හරි ගස්සල තියෙනවා. මේ ක්‍රීඩා කමිටු රැස්වීමට විතරක් ඇවිල්ල නිලධාරීන් කියනව මේක හදල නෑ කියලා. මම පුද්ගලිකව සල්ලඩි ගෙනල්ල සේවකයො දාල තමයි මැට් හලල පිට්ටනිය හැදුවෙ. දැනට ලක්ෂයට වඩා වියදම් කරල තියෙනවා. මේක මීට කලින් කානිවල්කීයකට දීල තියෙනවද? ප්‍රභුවරුන් උත්සව පවත්වල තියෙනවද? මේ එක නිලධාරියෙක් එක වාර්තාවක් දීල නෑ. අරන් බලන්න ඕනම ෆයිල් එකක. ඇස්තමේන්තුව ලක්ෂ හතරක් දීල තියෙනවා. මේක ඉතාම ද්වේෂ සහගතව කරන කටයුත්තක්. නිලධාරීන්ගේ කඹ ඇදිල්ලෙන් තුන්වන පාර්ශවයට හානියක් සිදු වෙනවා. ධර්මාශෝක විද්‍යාලය කියන්නෙ මගේවත් කාගෙවත් බූදලයක් නෙමෙයි. පොදු දේ වලදි අපි කටයුතු කිරීමෙ ක්‍රම වේදයක් තියෙනවා. ද්වේෂ සහගත ලෙස මේ කටයුතු කරන්න බෑ සභාපතිතුමනි. මම මාස තුනක් තිස්සෙ වාර්තාකරුවන්ගේ කතා ඉවසුවා. නිලධාරීන්ගේ උපදෙස් ඉවසුවා. යසරත්න මහතාට මම වගකීමෙන් කියනව කවදද වැඩ කරා බැලුවෙ කියලා. හාරල බැලුවොත් පස් අඩි කීයක් දාලද කියල බලන්න පුලුවන්. මේ ක්‍රීඩා කමිටු වාර්තාව සම්පූර්ණ වැරදියි. මම මාස තුනක් තිස්සෙ මේ දේ කරන්නෙ. මොකද දවස් දෙකක් කරනව. සුමානයක් වහිනවා. ඒව ස්වභාවික හේතු. අපි මේව නොකර ඉඳල නෑ. මේ ළමයි 5000 ක් ඉගෙන ගන්න ආයතනයක්. දේශපාලඥයන් මේක පාවිච්චි කරා. පැන් පාරක් ගහල නෑ නිලධාරීන්. එහෙම නම් මම යෝජනා කරනවා මේ පිට්ටනිය කිසි කෙනෙකුට දෙන්න එපා කියලා. කිසිම උත්සවයකට. මම වගකීමෙන් කියනවා සභාපතිතුමා මීට කලින් මේ පිට්ටනිය බුක් කරල මේ ආකාරයෙන් ඇස්තමේන්තු හදල මේ ආකාරයෙන් පරීක්ෂණය කරල කරපු වාර්තා මේ සභාවට

ඉදිරිපත් කරන්න කියලා. එතකොට මම මගේ මේ විරුද්ධතාවය සම්පූර්ණයෙන්ම ඉල්ලා අස්කර ගන්නවා. බැරිනම් කරුණාකරල ඒ නිලධාරින් ඇවිල්ල සමාව ගන්න සභාවෙ. මේ විදියට සභාව නොමග ය වනවට.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධයෙන් තීරණයක් ගන්න වුනේ ඒ නිලධාරියා කිව්ව මේක හලල දාන්න ඕනෙ කියල කිව්වම ක්ලබ් වලින් ප්‍රකාශයට පත්වුනා ගල් හලන්නෙ නැතුව ගල් පිටින්ම දානවයි කියලා. මම ඇහුව ඒක ඇත්තද කියලා. එහෙම ගල් හලල දැම්මයි කිව්ව. පසුව හලන්නෙ නැතුව දාන්නයි කියල අශෝක මහතා උපදෙස් දුන්නයි කිව්ව. මම ඒ වෙලාවෙ කිව්ව යසරත්න මහතාගෙන් ප්‍රකාශයක් අරගෙන මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරල වාර්තා කරන්නයි කියලා. මෙතන වෙලා තියෙන්නෙ එතන ක්‍රීඩා පිය භාරව හිටපු එකම නිලධාරියා යසරත්න මහතා. එයා තමයි ඒ ප්‍රකාශය කරන්නෙ. වරදක් තියෙනව නම් ඒ වරද නිවැරදි කිරීමේ බලය ඒ නිලධාරියාම සතුයි. ඇත්තටම මම මේ නිලධාරීන්ට කිව්ව නගර සභාවෙන් පිං පඩි ගන්න එපයි කියල. රටේ ජනතාව මේ රජයේ සේවකයන්ට පඩි ගෙවන්නෙ. අඩුම ගානේ ඒ පඩියට සරිලන සේවයක් කරන්න ඕනෙ මේ නිලධාරින්. මම පාලකයා වශයෙන් කරන්න පුලුවන් මේ සම්බන්ධයෙන් විභාගයක් තියල තීන්දුවක් මට දෙන්න කියල කියන එකයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්ලිව්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ඔබතුමා විභාග කරන්න කියල කියනවා. අද චෙක් කරල බලන්න අද ක්‍රීඩාංගණය භාරව ඉන්න නිලධාරියා දැන් ඔතන ඉන්නවද කියලා. මම ඔබතුමාට කලින් කියල ඇති පැවිලියන් එකේ කොන්ක්‍රීට් කැලි දාල තියෙන්නෙ කොහොමද කියලා. ඇයි ඒවට ඒගොල්ලො මේව වෙන්නෙ නැත්තෙ. අපිට මෙහිදී ජේනව හැම දේම සාධාරණ වෙන්න ඕනෙ. තමන්ගෙ ඩියුටිය ඉස්සෙල්ල කරන්න ඕනෙ. අපි සතුටු වෙන්න ඕනෙ පාසලෙන් මේක හදල දෙන්න පොරොන්දු වෙලා තියෙනවා. මම කියන්නෙ හැම දේම සාධාරණීකරණය වෙන්න ඕනෙ. එක එක්කෙනාගෙ පෞද්ගලික මත ඉදිරිපත් කරන්න බැහැ. ඒගොල්ලන්ටත් ඒ නීතිය ක්‍රියාත්මක කරල මේ සම්බන්ධව බලන්නයි කියල මම ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මම යසරත්න මහතාගේ කාර්ය දිගුව අත්සන් නොකර ඉන්න හැදුවෙ. ෆයිල් එකේ මෙයා වැඩ කරල නැහැයි කියල නිලධාරින් කිසිම දෙයක් සඳහන් කරල නැහැ. සේවකයන් සම්බන්ධයෙන් කරන වැරදි වලදී ඕන ලියුමක් පුද්ගලික ලිපිගොනුවත් එක්ක එවන්න ඕනෙ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේ ක්‍රීඩාපිට්යේ කානිවල් කරා. උත්සව වලට දුන්නා. අන්තිමට දුන්නෙ ධර්මාශෝක විද්‍යාලයට. ඔවුන් ප්‍රකාශ කරා ක්‍රිඩා පිට්ය තිබූ පිරිදි සකස් කර දෙන බව. ඒ සම්බන්ධයෙන් අපි ස්තුතිවන්ත වෙනවා. අපි මේ වෙනුවෙන් ලබාගෙන තියෙන අත්තිකාරම් මුදල එය සෑදීමට ප්‍රමාණවත් නෑ. මේ සභාව හැම විද්‍යාලයකටම සමානව සලකල තියෙනවා. විද්‍යාලයෙන් ක්‍රිඩා පිට්ය හදන්න පස් ගෙනල්ල දාල සතියක් විතර පස් හැලුව. එක පස් ලෝඩ් එකක් හැලුවහම පස් කියුබ් කාලක්වත් එන්නෙ නෑ. මම දැක්ක මෙතන කම්කරුවන් හය හත් දෙනෙක් හැමදාම වැඩ කරා. නමුත් මම බලපු හැම දවසකම මේ ක්‍රීඩා භූමි භාරකරු හිටියෙ නෑ. ඒ නිසා සභාපතිතුමනි මේක ඒ නිලධාරින්ගේ වගකීමක්. ඒ විද්‍යාලයෙන් කම්කරුවන් යොදවල තියෙනව නම් බඩු ගෙනල්ල තියෙනව නම් ඇයි අපේ නිලධාරීන්ට මේක බලන්න බැරි. මම එකම දවසයි දැක්කෙ අපේ නිලධාරියා එතන ඉන්නවා. අපේ නිලධාරින් වැඩ කරන්නෙ නැත්නම් මේ අයට ස්ථාන මාරුවක් හරි දෙන්න. මේ අදාල නිලධාරින් සම්බන්ධව අදාල විනය කටයුතු සිදු කරන්න කියල මම ඉල්ලා සිටිනවා. මම ලේකම්තුමාට හැමදාම කියන්නෙ තමන් යටතේ ඉන්න සේවකයන්ට ආයාචනා කරන්න එපා නියෝග දෙන්න කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපේ සරත් ශ්‍රීලාල් මන්ත්‍රීතුමා ප්‍රකාශ කල ආකාරයට මම දකින්නෙ අදාල නිලධාරීන් විසින් නිසි අධීක්ෂණය කරානම් පසුව වැරදි කීමේ අඩුපාඩුව අවම කර ගන්න තිබුණා. අවසානයේ මේවගේ කතිකාවතක් ඇති නොවෙන්න ඉඩ තිබුණා. මේ අනුව අපට පෙනෙන්නෙ මින් පෙර නියම විදියට ප්‍රතිසංස්කරණ කටයුතු සිදු නොවන වග තමයි. මේ දේ සම්බන්ධව ඉස්මතු කරල පෙන්නල පස්ස පාර එලවන ස්වභාවයක් පෙනෙනවා. මේ රජයේ සෙවකයින් ගන්න වැටුපට සරිලන සේවයක් කරන්න කියල ඔබතුමා පෙලින් පෙලටම කිව්ව. මෙම ක්‍රීඩාංගණයේ උත්සව කටයුතු කරපු අනික් විද්‍යාලත් එක්ක බැලුවම ධර්මාශෝක විද්‍යාලය ප්‍රතිසංස්කරණ කටයුතු අතින් ඉදිරියෙන් ඉන්නවයි කියන එකත් පැහැදිලියි සභාපතිතුමනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

මේ කොටස අයින් කර ගන්න. ඇප මුදල් නිදහස් කිරීම සම්බන්ධව. ධර්මාශෝක විද්‍යාලෙ වරදකින් නෙමෙයි ඒ දේ වුනේ. සේවකයො හය හත් දෙනෙක් දාල සති දෙකක් මේකෙ වැඩ කරා. වැස්සයි ස්වභාවික හේතුයි .......

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කලාප කාර්යාලෙ පාපන්දු තරගාවලිය කල් දාන්න වුනා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ඒක මම පිළිගන්නව සභාපතිතුමා. ඒ අයට සුදුසු ආකාරයට නැති වෙන්න ඇති. නමුත් ළමයි මේකෙ ක්‍රීඩා කරා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ වගේ දෙයක් දිගටම කරන්න බැහැ. ඉක්මනට කරල ඉවර කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

අපේ ප්‍රමාදෙකින් නෙමෙයි මේක සිද්ධ වුනේ. නිලධාරීන් කියපු හැම දිනකම සේවකයන් ගෙන්නල කරා. මේ අයහපත් කාලගුණයත් එක්ක තමයි මේ දේ වුනේ. නිලධාරීන් කියනව නම් තවත් මොනව හරි තියනව කියල කියන්න මොනවද තියෙන්නෙ කියලා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ කාර්ය ඉවරයි කියල අපිට වාර්තාවක් දීල මේ වැඩේ ඉවර කරන්න ඕනෙ. නැත්තම් අපට සල්ලි ගෙවන්න බැහැනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

කවුරුවත් නිලධාරීන් ගැන චෝදනා කරන්න ඕනෙ නැහැ. මේව ජනතාවගේ ප්‍රශ්න. ජනතාව මන්ත්‍රීවරු එක්ක තමයි මේව කතා කරන්නෙ. පොදු ප්‍රශ්න මේ සභාවෙදි කතා කරල ඊලග සභාව වන විටත් මේව වෙලා නැත්තම් ඒ අය කියනව මේ මේ මන්ත්‍රීතුමාට කිව්ව තාම වෙලා නෑ කියල. මේව අපේ පුද්ගලික මත නෙමෙයි. මන්ත්‍රීවරු සම්බන්ධවත් උපේක්ෂාවෙන් බලන්න කියල මම කියනවා.

- **මෙම වාර්තාවේ සඳහන් අම්බලන්ගොඩ මහජන ක්‍රීඩා පිටිය ධර්මාශෝක විද්‍යාලය විසින් අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳව ගරු නගර සභා පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා විසින් විරෝධතාවය පල කරන ලදී.**

**ඒ අනුව 2013 -05- 28 දින පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව සභා සම්මත විය.**

## (07) ටෙන්ඩර් හා මිල ගණන්

**7:1** **ටෙන්ඩර්** :- නැත

**7:2** **මිල ගණන්** :-

**7:2:1** පරිගණක අළුත්වැඩියාව සඳහා මිළ ගණන් කැඳවන ලද අතර ගණකාධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Shiva Computers | Ramcy Computers | LSJ Computers |
|---|---|---|---|---|---|
| 01 | Mother board | | 9600/- | 9700/- | 9500/- |
| 02 | Cooling Fan | | 300/- | 250/- | 200/- |

**7:2:2** Pen drive සඳහා මිළ ගණන් කැඳවන ලද අතර ගණකාධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනිමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Inhuk Computers | Omac Technology | Kobian Technology |
|---|---|---|---|---|---|
| 01 | Pen Drive (4 GB) | | 800/- | 700/- | 750/- |
| 02 | Pen Drive (8 GB) | | 1000/- | 900/- | 1050/- |

**7:2:3** ඇස්බැස්ටස් ෂීට් සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනිමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | BKS Company | Indunil hardware | Poorna Stores |
|---|---|---|---|---|---|
| 01 | 4’- 0” X 4’ – 0’’ ඇස්බැස්ටස් ෂීට් | | 520/- | - | 520/- |

**7:2:4** ටයර් සහ ටියුබ් සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිළ ගණන් පිලිගැනිමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඔබ්. දීපානන්ද | නපිත් කුමාර | ඔබ්. ලීලානන්ද |
|---|---|---|---|---|---|

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | Tyre (Bicycle) | | 760/- | 780/- | 780/- |
| 02 | Tube (Bicycle) | | 295/- | 300/- | 295/- |

**7:2:5** විදුලි පංකා සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ගම්පහ ඉලෙක්ට්‍රිකල්ස් | ජෙනරල් ස්ටෝර්ස් | |
|---|---|---|---|---|---|
| 01 | Table fan | | 2900/- | 3150/- | |
| 02 | Stand Fan | | 4200/- | 3850/- | |

**7:2:6** ගබඩා භාණ්ඩ සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඉදුනිල් හාඩ්වෙයාර් | පූර්ණ හාඩ්වෙයාර් | බී.කේ.එස්. පුද් සමාගම |
|---|---|---|---|---|---|
| 01 | ½’’Ø – 15m රබර් හෝස් | | 10000/- | 850/- | 925/- |
| 02 | Door closer | | 2300/- | 2250/- | 2000/- |

**7:2:7** විදුලි උපාංග සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඉදුනිල් හාඩ්වෙයාර් | පූර්ණ වෙළඳසැල | බී.කේ.එස්. පුද් සමාගම |
|---|---|---|---|---|---|
| 01 | CG Holders | | 30/- | 24/-<br>75/- | 97/- |
| 02 | Table Fan | | - | - | - |
| 03 | Stand Fan | | | - | - |

**7:2:8** සුචි කාඩ්පත් සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සක්වා ප්‍රින්ටර්ස් | ඕ ආර් එස් ප්‍රින්ටර්ස් | ආරියදාස ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | සුචි කාඩ්පත් | | 0.85 | 1.42 | 1.20 |
| | | | | | |

**7:2:9** පිත්තල සීනු සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | රාජපක්ෂ ස්ටෝර්ස් | ආර් එම් රවින්ද්‍ර | |
|---|---|---|---|---|---|
| 01 | පිත්තල සීනු - කුඩා | | 225/- | 265/- | |
| | පිත්තල සීනු - විශාල | | 425/- | 470/- | |

**(08)** **ගෙවීම්**

8. 1 ඇ. අංක 0481 යටතේ ඡායා පිටපත් යන්ත්‍රය වෙත ලබා ගත් Drum Unit එක සඳහා ධර්මපාල මාවත, පඹුරන, මාතර, මෙට්‍රොපොලිටන් ඔෆිස් ප්‍රයිවට් ලිමිටඩ් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි, රු. 28980.50 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.2 ඇ. අංක 0475 යටතේ ඡායා පිටපත් යන්ත්‍රය වෙත ලබා ගන්නා ලද Torner වෙනුවෙන් ධර්මපාල මාවත, පඹුරන, මාතර, මෙට්‍රොපොලිටන් ඔෆිස් ප්‍රයිවට් ලිමිටඩ් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 24080/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

Torner 4300/- X 5 - 21500.00
Vat - 2580.00
24080.00

8.3 ඇ. අංක 0476 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ටයර් වෙනුවෙන් 48, ඇල්පිටිය පාර, සුමිත් මාර්කටින් කම්පැනි වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 17310/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා ගැනීම.

185/- X 14 Tyre 02 X 8655/- - 17310.00

8. 4 ඇ. අංක 0494 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ගෑ වෙනුවෙන් මහ අම්බලන්ගොඩ එම්. පී. ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 72400/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

37.5 kg GAS 10 X 7240/- - 72400.00

8.5 ඇ. අංක 0500 යටතේ නගර සභා ට්‍රැක්ටර් සඳහා අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීම වෙනුවෙන් කොළඹ 03, Brown & Company වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 118918/24 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Fan Belt | 1275/- X 2 | - | 2550.00 |
| Lining & reverts kit | 1325/- X 6 | - | 7950.00 |
| Tractor meter | 12375/- X 1 | - | 12375.00 |
| Hourmeter Cable | 1575/- X 2 | - | 3150.00 |
| Aircleaner | 3750/- X 3 | - | 11250.00 |
| Beading | 830/- X 1 | - | 830.00 |
| Lamp | 11576/- X 2 | - | 23152.00 |

| | | | |
|---|---|---|---|
| Lamp (Headlight) | 11230/- X 4 | - | 44920.00 |
| | | | 106177.00 |
| | Vat | | 12741.24 |
| | | | 118918.24 |

8.6 ඇ. අංක 0602 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද නගර සභා සඳහා දෙහිවල හූම් ටෙක් ප්‍රයිවට් ලිමිටඩ් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 16500/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Senshin measuring wheel | 16500/- X 1 | = | 16500.00 |

8.7 ඇ. අංක 0496 යටතේ ලබා ගන්නා ලද නගර සභා ට්‍රැක්ටර් සඳහා අවශ්‍ය අමතර කොටස් සඳහා ලේකම්ගේ නිර්දේශය පරිදි කොළඹ 14, ජේතවන පාර, ඩීසල් ඇන්ඩ් මෝටර් කම්පැනි වෙත රු. 131006/40 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Starter Motor | 2 X 28795 | = | 57590.00 |
| Alterítor | 2 X 18255 | = | 36510.00 |
| Head Lamp | 1 X 3500 | = | 3500.00 |
| Head Lamp R/H | 2 X 3500 | = | 7000.00 |
| Frction Disc | 1X 2270 | = | 2270.00 |
| Actuating Disc | 1 X 10100 | = | 10100.00 |
| | | | 116970.00 |
| | Vat | | 14036.40 |
| | | | 131006.40 |

8.8 ඇ. අංක 0495 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ධූමායන යන්ත්‍රය වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි නුවර පාර, කැළණිය ජර්මනියා, කලම්බු ප්‍රයිවට් ලිමිටඩ් වෙත රු. 218400/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.9 ඇ. අංක 0486 යටතේ ලබා ගන්නා ලද GAS වෙනුවෙන් අම්බලන්ගොඩ මහ අම්බලන්ගොඩ එම්. පී. ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57920/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| 37.5 kg GAS 8 X 7240/- | - | 57920.00 |

8.10 ඇ. අංක 0483 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ලිපිද්‍රව්‍ය වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ මහාවීදිය, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත රු. 29900/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| Photo copy 40 X 585/- | - | 23400.00 |
| Ronio papers 20 X 325/- | - | 6500.00 |
| | | 29900.00 |

8.11 ඇ. අංක 0450, 470 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ලිපිද්‍රව්‍ය වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ කුලරත්න පාරේ, සක්වා ප්‍රින්ටර්ස් වෙත රු. 14625/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| File Covers 1500 X 9.50 | - | 14250.00 |
| Envelopes 6 X 3 1/2 500 X .75 | - | 375.00 |

14625.00

8.12 නගර සභාව සතු RA-8796 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 අප්‍රේල් මස ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 18216.80 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3903 | ඩීසල් | 36 |
| 3918 | ඩීසල් | 40 |
| | Engine Oil | 02 |
| 3926 | ඩීසල් | 29 |
| | Engine Oil | 05 |
| 3941 | ඩීසල් | 24 |

8.13 නගර සභාව සතු RA-3709 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 අප්‍රේල් මස ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 22890.30 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3891 | ඩීසල් | 40 |
| | Engine Oil | 03 |
| 3910 | ඩීසල් | 44 |
| 3917 | ඩීසල් | 17 |
| 3925 | ඩීසල් | 31 |
| | Engine Oil | 02 |
| 3942 | ඩීසල් | 41 |

8.14 නගර සභාව සතු 49-9422 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 අප්‍රේල් මස ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 15189.40 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3894 | ඩීසල් | 26 |
| 3914 | ඩීසල් | 35 |
| 3928 | පවර් ස්ටියරින් ඔයිල් | 01 |
| 3930 | ඩීසල් | 24 |
| | එන්ජින් ඔයිල් | 02 |
| 3944 | ඩීසල් | 29 |

8.15 නගර සභාව සතු 49-9436 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 අප්‍රේල් මස ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 16009.90 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3892 | ඩීසල් | 30 |
| 3911 | ඩීසල් | 36 |
| | එන්ජින් ඔයිල් | 01 |
| 3934 | ඩීසල් | 43 |
| 3943 | ඩීසල් | 20 |

8.16 නගර සභාව සතු GL-9369 අංක දරණ ගලි බවුසරය සඳහා 2013 අප්‍රේල් මස ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 34997.90 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3893 | ඩීසල් | 149 |
| 3920 | ඩීසල් | 140 |

8.17 නගර සභාව සතු LF-1853 අංක දරණ ටිපර් රථය සඳහා 2013 අප්‍රේල් මස ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 16954.00 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3888 | ඩීසල් | 80 |
| 3931 | ඩීසල් | 60 |

8.18 නගර සභාව සතු 252 - 0730 අංක දරණ කැබ්රථය සඳහා 2013 අප්‍රේල් මස ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 31364.90 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3896 | ඩීසල් | 49 |
| 3907 | ඩීසල් | 58 |
| 3917 | ඩීසල් | 39 |
| 3932 | ඩීසල් | 51 |
| 3939 | ඩීසල් | 62 |

8.19 නගර සභාව සතු 53 - 0529 අංක දරණ කැබ්රථය සඳහා 2013 අප්‍රේල් මස ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 27660.90 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3904 | ඩීසල් | 42 |
| 3908 | ඩීසල් | 54 |
| 3924 | ඩීසල් | 35 |
| 3936 | ඩීසල් | 32 |
| | එන්ජින් ඔයිල් | 02 |
| 3940 | ඩීසල් | 30 |
| 3948 | ඩීසල් | 26 |

8.20 අම්බලන්ගොඩ නගර සභා පුස්තකාල සඳහා 2013 අප්‍රේල් මස ලබාගත් පුවත්පත් වෙනුවෙන් රු. 34915.00 ක මුදලක් ප්‍රජා සංවර්ධන නිලධාරී හා ලේකම්ගේ නිර්දේශය මත, එම්. එස්. වීරසිංහ මහතා වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

8.21 2013 – II වන කාර්තුව VAT මුදල ලෙස රු. 50000.00 ක මුදල ලේකම්ගේ නිර්දේශය මත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.22 මහ අම්බලන්ගොඩ , අරුණි බිංදුහේවා මිය විසින් වැරදීමකින් අනතුරුදායක ගස් පෝරම දෙකක් ලබා ගැනීම හේතුවෙන් එක් පෝරම ගාස්තුව වන රු. 600.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය මත ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.23 2013/05/27 දින ශ්‍රී ලංකා පරිපාලන ආයතනයේ සහ කුරුවිට ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් අප ආයතනයට පැමිණීම වෙනුවෙන් දරණ ලද සංග්‍රහ වියදම් මුදල වන රු. 22934.75 සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.24 සරප් රාජකාරී කල පී. කුසුම් ද සිල්වා මියගේ ඇප තැන්පත් මුදල වන රු. 6028.34 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.25 මුහුදු වෙරළ හරස් පාර කාණු පද්ධතිය හා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රඳවාගත් මුදල ග්‍රාමීය සමෘද්ධි සංවර්ධන සමිතිය වෙත රු. 98000.00 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.26 මුහුදු වෙරළ හරස් පාර සංවර්ධනයේදී හානි වූ තාප්පය පිළිසකර කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රඳවාගත් මුදල ග්‍රාමීය සමෘද්ධි සංවර්ධන සමිතිය වෙත රු. 3312.16 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.27 හිරේවත්ත බුදු පිළිමය අසල නවීකරණය කර විදුලි පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් ලංකා විදුලි පුද්ගලික සමාගමට ගෙවිය යුතු රු. 11170.00 ක මුදල වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.28 හෙප්පුමුල්ල පෙර පාසලේ සිවිලිම සවි කිරීම වෙනුවෙන් ගෙවිය යුතු මුදල ආර්. ඊ. ද සිල්වා මාවත කුඩා ගම්මාන සමිතිය වෙත රු. 344204.75 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.29 හිරේවත්ත පිහිනුම් තටාකය අසල ඇඳුම් මාරු කිරීමේ ස්ථානයක් සකස් කිරීම වෙනුවෙන් 1 වන ගෙවීම් වාර්තාව මුදල ආර්. ඊ. ද සිල්වා මාවත කුඩා ගම්මාන සමිතිය වෙත රු. 371233.51 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.30 ගාළු පාර දොළොස්මහේ අසල පොදු නාන ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම (අතිරේක) වෙනුවෙන් ආර්. ඊ. ද සිල්වා මාවත කුඩා ගම්මාන සමිතිය වෙත රු. 12882.00 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.31 කෙරමිණිය පුස්තකාල ඉඩමේ පිහිටි පෙර පාසල සංවර්ධනය කිරීම වෙනුවෙන් බටපොල බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත රු. 9960.74 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.32 කෙරමිණිය පොකුණ පාර අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් කෙරමිණිය කුඩා සම්මාන සමිතිය වෙත රු. 173289.01 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.33 හල්වතුර අඩු ආදායම් නිවාස අසලින් යන මාර්ගය කොන්ක්‍රීට් කිරීම රඳවා ගත් මුදල් ආපසු ගෙවීම වෙනුවෙන් හෙප්පුමුල්ල ග්‍රාමීය සමෘද්ධි බලකාය වෙත රු. 31445.03 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.34 කැබ් රථය අලුත්වැඩියාව සඳහා ලබා ගත් රු. 20000.00 ක අත්තිකාරම් මුදලින් රු. 19930.00 ක මුදලක් වියදම් වීම වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:35 2013 මාර්තු මාසයට අදාල ජල බිල්පත් සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවීම්

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11453 II | 9636.48 |
| 23453 II | 10292.46 |
| 34453 II | 876.96 |
| 52453 II | 27751.60 |
| 62453 II | 25871.38 |
| | 74428.88 |

ජල බිල්පත් සඳහා රු. **74428.88** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම.

8:36 2013 පෙබරවාරි මාසයට අදාල විදුලි බිල්පත් සඳහා සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 53454 | 18,284.75 |
| 52453 I | 31,033.65 |
| 62453 I | 17,392.15 |
| 34453 I | 5,061.91 |
| 23453 I | 1,402.51 |
| 11453 I | 43,676.89 |
| | **116,851.86** |

විදුලි බිල්පත් සඳහා රුː **116,851.86** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම.

8:37 2013 මාර්තු මාසයට අදාල දුරකතන බිල්පත සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට හා ඩයලොග් ආයතනයට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11452 | 25177.12 |
| 12452 | 1297.65 |
| 25451 II | 3113.45 |
| 62452 I | 1,379.33 |
| | **30967.55** |

දුරකතන බිල්පත සඳහා රුː **30967.55** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම.

8.38 තල්ගස්ගොඩබැද්ද ඉඩම හෙලි පෙහෙළි කිරීමේ කර්මාන්තයේ රඳවාගත් මුදල වන රු. 36264.70 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි එකමුතු ග්‍රාමීය සමෘද්ධි බලකාය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.39 විලේගොඩ අංක 2/30 අසලින් යන හරස් පාර කාණුව කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ I වන කොටස් ගෙවීමේ මුදල වන රු. 218227.40 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි බටපොල බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.40 මහජන පුස්තකාලයට සම්බන්ධ E-library ඉදිකිරීමේ කර්මාන්තයේ I වන කොටස් ගෙවීමේ මුදල වන රු. 356645.80 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි බටපොල බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.41 මහ අම්බලන්ගොඩ අංක 84A ලිපිනයේ පදිංචිව සිටි කේ. ප්‍රේමදාස මහතාගේ ආදාහනය වෙනුවෙන් අය කල මුදලින් රු. 2000.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය මත නැවත ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.42 තුයියලාගේ සුමනදාස මහතාගේ ආදාහනය වෙනුවෙන් අය කල මුදලින් රු. 2000.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය මත නැවත ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.43 කුලසිරි පරණවිතාන මහතාගේ ආදාහනය වෙනුවෙන් අය කල මුදලින් රු. 2000.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය මත නැවත ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

## (09) ගිණුම්

**9:1** 2013 අප්‍රේල් මාසයේ වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය - පොදු ගිණුම, මුදල් සාරාංශය හා ලැබීම් විග්‍රහය සභාවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව 2013 අප්‍රේල් මස ගිණුම් වාර්තා පිළිගතයුතු බව ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතාගේ හා ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## (10) ඇස්තමේන්තු

**10.1** තල්ගස්ගොඩ පුංචි පාලම අසල සිට පල්ලෙනොට පාර දක්වා පදික මංතීරුවක් සැකසීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 3000000/- ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේකට කලින් ඇස්තමේන්තුවක් හැදුව ලක්ෂ පනස් හයකට. මේකෙ මුල් අදියර යටතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ලක්ෂ 30 ක මුදලක් ලබා දුන්නා. ඒ සම්බන්ධයෙන් අපි එතුමාට මේ අවස්ථාවේ ස්තූතිය පුද කර සිටිනවා.

**<u>තීරණය</u>**

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.2** හිගල්දූව ප්‍රිය නිවස අසල මායිම් තාප්පය ඉදිකිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 155326. 16 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>තීරණය</u>**

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.3** හිගල්දූව පාර පැති බැම්ම සකස් කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 117481.15 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>**තීරණය**</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.4** පටබැඳිගෙදරවත්ත දෙවට I මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 263515.50 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>**තීරණය**</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.5** ධම්මකුසල මාවත ආරම්භක ස්ථානයේ පෙට්ටි බෝක්කුවක් ඉදිකිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 121282.43 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>**තීරණය**</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.6** ධම්මකුසල මාවතේ කාණු පද්ධතිය කොන්ක්‍රීට් කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 596619.65 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>**තීරණය**</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.7** කන්ද පාර I වන හරස් පාර කාණුව කොන්ක්‍රීට් කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 147984.38 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>**තීරණය**</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.8** ඩයලොග් ආයතනයේ භූගත විදුලි රැහැන් පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා පාර පලුදු කිරීම වෙනුවෙන් වැඩ අධිකාරී විසින් සකස් කරන ලද සංඝරාජ මාවත සඳහා රු. 202310.29 ක් වූ ඇස්තමේන්තුව සහ පීරිස් වෙද මාවත සඳහා රු. 41003.96 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

මෙම ආයතනය සඳහා මීට පෙර ඇස්තමේන්තුවක් සකස් කර ඇති බවත් ඔවුන් විසින් මුදල් නොගෙවා හොර රහසේ රාත්‍රී කාලයේ රැහැන් පද්ධතියක් යෙදීමට උත්සාහ දරා ඇති බවත් එබැවින් අප ආයතනය නොසලකා ඇති බව පෙනී යයි. එම නිසා ඉහත ඇස්තමේන්තු වලට අමතරව රු. 250000/- ක ඇප මුදලක් ලබා ගැනීම සුදුසු බවත් වැඩ අධිකාරී මහතා විසින් යෝජනා කර තිබුණි.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මීට ප්‍රථම ඉදිරිපත් කෙරුණු ධීවර වරායේ අයිස් ගබඩාව සඳහා ඉදිරිපත් කෙරුණු අයිස් ගබඩාවේ දීල තිබුණෙ තුන් ලක්ෂ හතලිස් දහස් ගානක්. සභාවෙ කියවුනෙත් ඒ ටික විතරයි. නමුත් නිර්දේශෙ තියෙනවා මෙම මාර්ගය පලුදු කිරීමෙන් පසු එම මාර්ගය පෙර පැවති ආකාරයෙන් විදුලි සමාගම විසින් සකස් කල යුතුය. එසේ කරන තෙක් ලක්ෂ තුනක ඇප මුදලක් ඉහත දෙපාර්තමේන්තුව විසින් අමතරව ලබා ගත යුතුයි කියල ඒ වාර්තාවෙ තිබුණ. නමුත් ඩයලොග් ආයතනයට මෙම මාර්ගය පලුදු කිරීමේදී එවැනි කිසිදු කොන්දේසියක් ලබා දීල නෑ. මම දන්නෑ මීට ප්‍රථම මෙම ඇස්තමේන්තු සකස් කිරීමේදී මාර්ග එලුදු කිරීමේදී ඇස්තමේන්තු මුදලක් ලබා ගැනීමේදී ඒ ආයතනය විසින් එම මාර්ගය සකසා දිය යුතුදැයි මම මීට පෙර අසා තිබුනෙ නෑ. නමුත් මීට පසුව ඉදිරිපත් වුන ඩයලොග් සමාගමට එම නිර්දේශය නෑ. නමුත් අයිස් කර්මාන්තය සඳහා එම විදුලි සමාගම විසින් මෙම මාර්ගය සකසා දිය යුතු යැයි යෝජනා කරල තියෙනවා. මේ විදියට ආයතන දෙකකට වෙන් වෙන් විදියට කටයුතු කිරීමට හේතුව මම දන්නෙ නැහැ. නමුත් ඩයලොග් ආයතනයේ මීට පෙර කරපු ඇස්තමේන්තුවෙත් මේක නැහැ. ඒ අය පාර කැඩුවට පස්සෙ තමයි මේක කියල තියෙන්නෙ. මොකක්ද මේ ක්‍රියා කරන ආකාරය.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මම හිතන්නෙ පාර පලුදු කරල හදන්න ඇස්තමේන්තුවක් සකස් කරල තියෙනවා. මමත් අහල නෑ ඇස්තමේන්තුවේ මුදල සභාවට ගෙව්වහම අදාල පුද්ගලයා විසින් ඒ පාර පලුදු කරන්න දෙනවා. එතකොට අපි මේකට මුදල් අය කරගෙනනෙ තියෙන්නෙ. එතකොට සභාවෙන් නේද හදන්න ඕනෙ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මේ සම්බන්ධයෙන් මම විමසීමක් කරා. මට ලැබුන පිළිතුර වුනේ මේ ඇස්තමේන්තුව දීල තියෙන්නෙ සභාවට වෙන අලාභය සම්බන්ධයෙන් කියල. සභාවෙ අවශ්‍යතාවයට නෙමෙයි මේව කඩන්නෙ. ඒගොල්ලන් එතකොට ප්‍රතිසංස්කරණය කරන්න ඕනෙ.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

සභාපතිතුමනි එතකොට ජල සම්පාදනෙන් පාර කඩනවනේ. එතකොට කවුද හදන්නෙ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

ජල සම්පාදනෙන් කඩන ඒව සියල්ලම ජල සම්පාදනෙන් හදනව.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මම කියන්නෙ ගෙවල් වලට දෙනකොට

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

ජල සම්පාදනෙන් ඒ ප්‍රතිසංස්කරණය කිරීම කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

සභාපතිතුමනි ඒ ක්‍රමයට බැරිද මේක කරන්න.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

තාක්ෂණ වාර්තාවක් දෙන්නෙ මම නෙමෙයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

අපි අහන්නෙ ඔබතුමාගෙන්.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ඩයලොග් ආයතනයට දෙන එක මේකටත් දෙනන් ඕනෙ. අපට පොඩි දෙගිඩියාවක් තියෙනවා මෙතනදි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

වැඩ අධිකාරීතුමා මේකෙදි මොකද වුනේ කියල සභාව දැනුවත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

නිවෙස් වලට ජල සම්බන්ධතාවය දෙනකොට සල්ලි බැන්දම නගර සභාව විසින් හදනව නේද. ඒ ක්‍රමයට හදන්න බැරිද.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් මහතා කථා කරමින්,</u>**

මීට ඉස්සර මේවගේ ව්‍යාපෘතියක් කරල වහල නැති කෙනෙක් ඉන්නවද. මීට පෙර මේවගේ ඇස්තමේන්තු කරල එම ආයතනයම නැවත පෙර තිබූ තත්වයට මාර්ගය සකසා දීල තියෙනවද. ඩයලොග් ආයතනයට ඩිපොසිට් එක තියන්න කියල ලියල තියෙනනේ මාර්ගය අනවසරයෙන් පලුදු කරාට පස්සෙ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මේවගේ තත්වයක් මීට පෙර මේ සභාවෙ මම දැකල නැහැ. වතුර ගත්තහම පස් දාල වහල දෙනවා. කවදාවත් තාර දාල දෙන්නෙ නැහැ. සභාවෙන් තාර දානකොට තාර දානවා. ඊට අමතරව පොල්වත්ත ප්‍රදේශයේ පාරවල් ටිකක් හැදුවා ව්‍යාපෘතියක් මගින්. ඒ අවස්ථාවෙදි ඒ පාරවල් හැදුවා. මේ සභාවට පාරවල් කඩනවට අය කරගෙන තමයි දුන්නෙ. හැබැයි ඔබතුමා කියන කතාව මෙතන කියන්න එපා. ඒ පාරවල් ජල සම්පාදනෙන් හැදුවෙ නෑ. ඒගොල්ලන් කාණු වැහුව විතරයි. සභාපතිතුමනි අපි පාර කඩනවටත් අලාහෙ ගන්නව. පාර ආපසු හදනවටත් නැවත තැන්පතුවක් ගන්නව. මේක අසාධාරණයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් මහතා කථා කරමින්,</u>**

නිවසකට වතුර දෙන්න මාර්ගය පලුදු කරහම මේ විදියට ගන්නවද.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

ගෘහස්ථ සහ ව්‍යාපාරික ආයතනයකට දීම අතර වෙනසක් තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් මහතා කථා කරමින්,</u>**

මේ ආයතනයකට බැහැ මාර්ගය කාපට් යොදල සකස් කරන්න. එහෙම නම් ඇස්තමේනතුව වැඩි කරල අප ආයතනයෙන් හරි සකස් කරන විදියට ඇස්තමේන්තු හදන්න.

**<u>තීරණය</u>**

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.9** 2013- 06- 05 දින ලෝක පරිසර දිනය නිමිත්තෙන් ක්‍රියාත්මක කරන වැඩසටහන සඳහා වැය ඇස්තමේන්තුව වන රු. 121500.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

ලෝක පරිසර දිනය නිමිත්තෙන් අපි වැඩ සටහනක් සකස් කරල තියෙනවා. 06/05 දින පාසල් සිසුන් දැනුවත් කිරීම සහ පලතුරු පැල බෙදා දීම සිදු කරනවා. ඒවගේම හල්වතුර ඇල දෙපස රුක්රෝපන වැඩ සටහනක් ක්‍රියාත්මක කරනවා. 06/06 දින හල්වතුර පොඩි ඇල මාර්ගය සුද්ධ කරනවා. 06/07 දින නගර සභා ගොඩනැගිල්ල හා අවට පිරිසිදු කිරීම කරනවා. 06/08 වෙනිදා ඩෙංගු රෝග මර්දන ශ්‍රමදාන ව්‍යාපාරයක් ක්‍රියාත්මක වෙනවා. මේ සඳහා හමුදා නිලධාරීන් 50 දෙනෙකුගේ සහාය ලැබෙනවා. සියලුම මන්ත්‍රීතුමන්ලා මේ සඳහා දායක වෙන්න කියල ඉල්ලා සිටිනවා. අම්බලන්ගොඩ නගරය දැනට ඩෙංගු රෝග ව්‍යාප්තිය වැඩි ප්‍රදේශයක් ලෙස ප්‍රකාශ කරල තියෙනවා. මේ සඳහා පොලිසියත් යොදවනවා. අද දින අපි ධූමායන යන්ත්‍රයක් ගේන්න කොළඹ යැව්ව.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි තල්ගස්ගොඩ පාරෙ එක තැනක තියෙනවා කුණු දාල. දාල ගොඩගහල යන්න බැහැ. තාර පාරටම ඇවිල්ල තියෙන්නෙ. මම හැමදාම කියනවා නඩු දාන්න කියලා. ලෝක පරිසර දිනයට ඉස්සෙල්ල මේක සුද්ධ කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි නීති විද්‍යා පීඨය වැහුව ඩෙංගු වසංගතය නිසා පසුගිය දිනක. පාසැල් වහල තියෙනවා. ඒ නිසා මේ ගැන අවධානය යොමු කරන්න ඕනෙ. තමන්ටත් මේ දේ වෙන්න පුලුවන්. අට වෙනිදා තියෙන ඒ වැඩ සටහනට අපි සූදානම්. අවශ්‍ය පහසුකම් ලබා දෙන්නයි කියල ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මගේ පුතාටත් ඩෙංගු හැදුනා. මම දකිනවා නිවාස වලට වඩා කාණු වලින් ඩෙංගු ව්‍යාප්ත වීමේ අවධානමක් තියනවා කියලා. උදාහරණයක් විදියට රෝයල් එක ගාව කාණුව. පල්ලියබඩ වත්තෙ දිගටම ඩෙංගු තිබුණා. අපි හරි ඒක සුද්ධ කරන්න ඕනෙ. කුලරත්න පාරෙ පාලම ගාව කාණුව නිසි ආකාරව වතුර බහින්නෙ නැති හින්ද එතන වතුර රැඳිල තියෙනවා. එතන දිගටම ඩෙංගු හැදුනා. විද්‍යාල මාවතේ ගිහිල්ල බහින තැන එතනත් වතුර බහින්නෙ නැ. එතනත් ඩෙංගු හැදුනා. මම සභාවාර ගානකදි කිව්ව මේ කාණුව හදාගන්න කියලා. මේක දුම්රිය දෙපාර්තමේන්තුවේ කාණුවක්. අපි එස්. පී. ඒ. ද සිල්වා මාවතේ කාණු බැන්ද. ඒකෙ වතුර බැස්ම හොරයි. ඔබතුමා ගිහින් බලන්න පොල්වත්ත පරණ පාර. කාණුවල තත්වෙ කොහොමද කියලා. මේ කාණු සේරම හිරවෙලා තියෙන්නෙ. අපි නිවෙස් වලටත් බලන්න යන්න ඕනෙ. ඒවගේම අපි හඳුනාගත්ත දේවල් දැන් නම්බිමුල්ල හරස් පාරෙ එකලග දෙන්න තුන්දෙනාට ඩෙංගු හැදුනා. ඒ කාණුවෙ තැනක් හිරවෙලා. ඒවගේ තැන් තියෙනවා. මේ වතුර රැඳෙන තැන්. මහ

අම්බලන්ගොඩත් සමහර තැන්වල වතුර බහින්නෙ නෑ සභාපතිතුමනි. ලෙවල් නෑ. ඒ ස්ථාන ඉස්සෙල්ලම අපේ සේවකයො දාල පිරිසිදු කරල පටන් ගන්න ඕනෙ. ඊලගට තමයි ගෙවල් වලට යන්න ඕනෙ. අපි දන්නව ගෙවල්වල වාර්තා වෙන ඒව. එම්. ඕ. එච්. ට එන්නෙ නෑ. මම දන්නව බෙහෙත් අරගෙන හොද වෙච්ච. මේ වැඩ සටහන හොදයි. මම ඉල්ලා සිටිනවා නගර සභාවෙන් කාණු ටික ශුද්ධ කරල කාණුවල වතුර බැස්ම නිසි ආකාරව සකස් කරන්න කියල.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**

සභාපතිතුමනි අපි දිගින් දිගටම කිව්ව ගලි බවුසරය යොදල මේ කාණු සුද්ධ කිරීම කරන්න කියල. ඒක ගානකට ගත්තෙ නැහැ. අන්තිමට සියල්ල වුනහම තමයි මේක යොදවන්නෙ. මේ ගැන කියල වැඩක් නැහැ. මේ වැඩ සටහන යටතේ විතරක් නෙමෙයි සභාපතිතුමා ගලි බවුසරය යොදවන එක නිරන්තරවම කරන්න කියල මම කියනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මේ තත්වය ගිය මාසෙ වෙනකොට තිබුණෙ නැහැ. අද වෙනකොට ඩෙංගු අවදානම් තත්වයක් ඇති වෙලා තියෙනවා. මේ වර්ෂාවත් එක්ක ඇතිවුන තත්වයක්. ඒකට අපි සභාවක් විදියට ගත යුතු ක්‍රියාමාර්ගය තමයි අරගත්තෙ.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**

සභාපතිතුමනි ඔබතුමත් සියලු දේම පසු විපරම් කරනවා. මුදල්මය ප්‍රතිපාදනත් ලබා දෙනවා. නමුත් නිලධාරීන්ගෙ පැත්තෙන් කෙරෙන්නෙ නැහැ. මේ සභාවෙ තරම් නිලධාරීන් අවශ්‍ය දේවල් ලබා දෙන සභාවක් තව නැතුව ඇති. ට්‍රැක්ටර් ලබා දුන්නා. ටේලර් ලබා දුන්නා. අමතර සේවකයන් ලබා දුන්නා. මේ දේවල් කරේ ඔබතුමා මේ දේ කලින් දැකපු නිසයි. මේ එක්කෙනෙකුගෙ දෙන්නෙකුගෙ නොසැලකිලිමත් කම නිසා මේ දේවල් යටපත් වෙනවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට මම වේදනාවෙන් කියන්නෙ මේක මැතිවරණ සමයකදි දේශපාලන මාතෘකාවක් කර ගන්න පුලුවන්. අපි දිගින් දිගටම රෝගීන් ඉන්න තැන් කිව්වට ඒව ගනන් ගත්තෙ නැහැ. කණගාටුවෙන් කියන්නෙ මේ සභාව තරම් නිලධාරීන්ට වැඩ කරන්න නිදහස දීපු වෙනත් සභාවක් දකුණු පළාත තුලම නැහැ මම හිතන්නෙ. අත දිගහැරල ප්‍රජා කටයුතු කරනව. කුණු කසල ඉවත් කරනව. එහෙම කරල මේ උවදුර අනතුරු දායක තත්වයට ආවම ඇත්තටම කණගාටුයි. මේවගේ කොතන හරි අඩුවක් තියනවා. පහලම ස්තරයෙ නම් නෙමෙයි. කුණු අදින කාණු සුද්ද කරන අය ගැන නෙමෙයි මම කතා කරන්නෙ. ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීවරුන් සහ පල්ලෙහාම ස්තරය අතර තුර පිරිසකගෙන් තමයි මේ අඩුව සිදු වෙන්නෙ. සියලුම ක්ෂෙත්‍රවල මේ තත්වය තියෙනවා. අපි කොච්චර දර දිය ඇද්දත් වැඩක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

සභාපතිතුමනි නිවෙස්වල තිබෙන වතුර රැදෙන දේවල් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන්නෙ නැද්ද. නීතියට තමයි මිනිස්සු බය වෙන්නෙ. ගිහිල්ල බලල යම් දෙයක් තියෙනව නම් ඒවෙලෙම නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෙ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මම ගිය සභාවෙ ඉල්ලුව මහා විදියේ සහ ගාලු පාරේ කාණු අපි විසින් පතුල ලෙවල් කරල හදන්න කොමසාරිස්තුමාගෙන් අවසරයක් අරගෙන ඇස්තමේන්තුවක් හදන්න කියලා. ඒ ඇස්තමේන්තුව ආවෙ නැහැ. වැඩ අධිකාරීතුමා පතුල ලෙවල් කරන්න විතරක් ඇස්තමේන්තුවක් හදන්න. මේව අපේ කාණු නෙමෙයි.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මෙවැනි වැඩසටහනක් තියෙනව කියල දැන් තමයි මම දැනගත්තෙ. ගම් මට්ටමින් අපි මිනිස්සු දැනුවත් කරන්න ඕනෙ.

**තීරණය**

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**(11)** වෙනත් කරුණු නැත

**(12)** න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12:1** ' පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගණය මුදල් අය කිරීමකින් තොරව ලබා ගැනීම " මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ගමනාගමන මණ්ඩලය ක්‍රිකට් කණ්ඩායම අතර සුහද ක්‍රිකට් තරගයක් 2013- 06- 01 දින පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත් ඒ සඳහා මුදල් අය කිරීමකින් තොරව ක්‍රීඩාපිටිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ගමනාගමන මණ්ඩලය ක්‍රිකට් කණ්ඩායම අතර සුහද ක්‍රිකට් තරගය සඳහා 2013- 06- 01 දින පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණය මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:2** ' වෙසක් දන්සැල සඳහා පුටු 200 ක් ලබා ගැනීම " මැයෙන් කුලරත්න හරස් පාර උදාහිරු යෞවන සමාජය විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ කුලරත්න හරස් පාර උදාහිරු යෞවන සමාජය විසින් පවත්වනු ලබන වෙසක් දන්සැල සඳහා ප්ලාස්ටික් පුටු 200 ක් මුදල් අය කිරීමකින් තොරව ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **වෙසක් දන්සැල සඳහා පුටු 200 ක් මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:3** ' ධීවර සංකීර්ණ ශාලාව වෙන්කර ගැනීම " මැයෙන් ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

මාගේ සමාංක හා 2013-05-08 ලිපිය අනුව 2013- 06- 14 දින පැවැත්වීමට නියමිත ආබාධිතයින්ගේ ප්‍රසංගය එදිනට නොපැවැත්වෙන අතර මෙම ප්‍රසංගය 2013-06- 21 දින පැවැත්වීමට තිරණය කර ඇති බවත් ධීවර සංකීර්ණ ශාලාව මුදල් අය කිරීමකින් තොරව ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තිරණය</u>

☞ **ආබාධිතයින්ගේ ප්‍රසංගය 2013-06- 21 දින පැවැත්වීමට ධීවර සංකීර්ණ ශාලාව මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:4** ' අම්බලන්ගොඩ THW නිවාස සඳහා ඔප්පු ලබා දීම " මැයෙන් ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

උක්ත යෝජනා ක්‍රමය සඳහා තල්ගස්ගොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇති බවත් එය අම්බලන්ගොඩ නගර සභාව සතු ඉඩමක් බවත් 2013- 05 -09 දින ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ ගත් තීන්දුව පරිදි අදාල නිවාස වලට ඔප්පු ලබා දීමට කටයුතු කරන ලෙසත් දන්වා තිබුණි.

<u>තිරණය</u>

☞ **ප්‍රාදේශීය ලේකම් තුමියගේ මැනුම් ලබා ගෙන ඉඩම් කච්චේරි තබා THW නිවාස සඳහා ඔප්පු ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:5** ' ආබාධිත තැනැත්තන්ගේ සැගවුනු රිද්ම සංගීත ප්‍රසංගය " මැයෙන් ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අවශ්‍යතා සහිත අයගේ සැගවුන දක්ෂතා එළිදක්වන කලා ප්‍රසංගය 2013- 06- 21 දින ධීවර සංකීර්ණ ශාලාවේදී පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත් ඒ සඳහා අනුග්‍රහයක් ලබා දීමට කටයුතු කරන ලෙසත් දන්වා තිබුණි.

**නගර සභා ආඥා පනතේ මේ සඳහා බලය ඇත්නම් රු. 5000/- ක මුල්‍යමය දායකත්වයක් ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

<u>තිරණය</u>

☞ **නීත්‍යානුකූලව ලබා දිය හැකි නම් රු. 5000/- ක මුල්‍යමය දායකත්වයක් ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:6** ' අම්බලන්ගොඩ බෞද්ධ කාන්තා සමිතියේ රැස්වීම සඳහා අවශ්‍ය පුටු ලබා ගැනීම " මැයෙන් අම්බලන්ගොඩ බෞද්ධ කාන්තා සමිතිය විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

ඉහත නම් සඳහන් සමිතියේ මාසික රැස්වීම සඳහා විශ්‍රාමික සංගමයෙන් පුටු ලබා ගැනීමේදී ඒ සඳහා මුදලක් අය කරන බවත් අප සංගමය සතුව විශාල අරමුදලක් නොමැති බවත් එබැවින් අ. ම. කරුණාරත්න දෙටු පුරවැසි පියසෙහි තිබෙන පුටු 25 ක් නොමිලේ ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

අ. ම. කරුණාරත්න දෙටු පුරවැසි පියස සඳහා පුටු 25 ක් සභාවෙන් ලබා දෙන්න. ඒ පුටු රැස්වීම් වලදී නොමිලේ ලබා දෙන්න. එතන දැන්වීමකුත් ගහන්න පුටු 25 ක් නොමිලේ ලබා දෙනවයි කියල.

තීරණය

☛ **බෞද්ධ කාන්තා සමිතියේ රැස්වීම සඳහා අවශ්‍ය පුටු මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. අලුතින් පුටු 25 ක් අ. ම. කරුණාරත්න දෙටු පුරවැසි පියසට ලබා දීමටද සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:7** **‘** පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණය වෙන්කර ගැනීම් “ මැයෙන් පොල්වත්ත අග්ගාරාම විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

කළ්‍යාණවංශ නිකායේ වාර්ෂික උප සම්පදා උත්සවය 2013- 06- 15 දින විහාරස්ථානයේ පැවැත්වෙන බවත් එදිනට පොල්වත්ත ක්‍රීඩාංගණය වෙනත් කටයුතු සඳහා අවසර ලබා නොදෙන ලෙසත් උත්සවයට පැමිණෙන අයට විවේක ගැනීම සඳහා එදින විහාරස්ථානය වෙනුවෙන් ක්‍රීඩාංගණය නොමිලේ වෙන් කර දෙන ලෙසටත් ඉල්ලා තිබුණි.

තීරණය

☛ **2013- 06- 15 දින පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණය මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:8** **‘** දැන්වීම් පුවරුවක් නොමිලේ ප්‍රදර්ශනය කිරීම “ මැයෙන් බලපිටිය, මහලදූව සිරි විමලසිරි දහම් පාසල විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අප දහම් පාසල විසින් සංවිධානය කරනු ලබන පොසොන් පහන් කූඩු තරගය 2013- 06- 23,24,25 දිනයන්හි පැවැත්වෙන බවත් එහි 5’X3’ ප්‍රමාණයේ කටවුට් එකක් නගරය තුල නොමිලේ ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

☛ **බලපිටිය, මහලදූව සිරි විමලසිරි දහම් පාසලේ දැන්වීම් පුවරුවක් ගාස්තු අය කිරීමකින් තොරව ප්‍රදර්ශනය කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:9** **‘** මාර්ගයට මුහුදු වැලි දැමීමෙන් වන හානිය “ මැයෙන් නගර වැසියෙක් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අවමගුල් උත්සව අවස්ථාවලදී මාර්ගයට වැලි ඉසීම නිසා මෝටර් රථ හා යතුරු පැදි ලිස්සා යාම පාරේ ගමන් කරන්නන්ගේ ඇසු වල දූහිවිලි යාම වරිනි අනතුරු සිදු වන බවත් එම වැලි සේදී ගොස් කාණු පිරීම සිදු වන බවත් මේ සඳහා පියවරක් ගන්නා ලෙසටත් ඉල්ලා තිබුණි.

තීරණය

☛ **අවමගුල් උත්සව අවස්ථාවලදී මාර්ගයට මුහුදු වැලි දැමීම සිදු නොකරන ලෙසට ජනතාව දැනුවත් කිරීමට සභාව තීරණය කරන ලදී.**

**12:10** ' දෙවනිවර ප්‍රජා සත්කාරයට ප්‍රතිචාරය " මැයෙන් අම්බලන්ගොඩ නගර වැසියෙක් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

හිරේවත්ත ප්‍රසිද්ධ නාන ළිද ප්‍රතිසංස්කරණය කිරීම සම්බනධයෙන් ස්තුතිවන්ත වන බවත් දෙවන ප්‍රජා සත්කාරය වන නගරයට ඇතුලු වන ස්ථානයේ ඉදිකිරීම සම්බන්ධයෙන් අගේ කොට සලකන බවත් තුන්වන බලාපොරොත්තුව වන්නේ මේ ප්‍රදේශ දෙක අතර පිහිටි අවලස්සන ප්‍රදේශය ඉවත් කර නගරය අලංකාර කිරීමට කටයුතු කරන ලෙසත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:11** ' බස් නැවතුම්පොල සාප්පු සංකීර්ණය නව තක්සේරුව " මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

බස් නැවතුම්පොල සාප්පු සංකීර්ණයේ කඩ කාමර අවසන් වරට තක්සේරු කර ඇත්තේ 2001 වසරේ බවත් නව තක්සේරුවක් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ඔය ආකාරයෙන් තක්සේරු කරල තමයි පොල්වත්ත සාප්පු සංකීර්ණයේ බද්ද එක පාරටම වැඩි වුණා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

නීතිය අනුව අවුරුදු පහෙන් පහට කල යුතුයි. දැනට අවුරුදු 12 ක් කරල නෑ. අවුරුදු 5 කට පෙර තක්සේරු කරල නැත්නම් අනික් කඩත් තක්සේරුවක් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි සතොස සහ පොල්වත්ත වෙළඳ සංකීර්ණයේ වැඩි කරන අවස්ථාවෙදි අපි මේ ගරු සභාවෙදි මතක් කරලත් ඇයි ඒක ඒ අවස්ථාවෙදි සිද්ධ නොවුනේ කියන එක. සමහර වෙළඳ ස්ථාන වල දැන් බස් නැවතුම්පොල වෙළඳ ස්ථාන වලට වඩා වැඩි කිරීම කරනවා. ඒ අවස්ථාවෙදි අපි මතක් කරා ඒ දේ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

බස් නැවතුම්පොලේ ඉදිරිපිට තියෙන පේමන්ට් එකේ ඉන්න අය ඒ කඩේට දවසට රු. 1000/- ක් ගෙවනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මම කියන්නෙ අර අවස්ථාවෙදි ඒක පැහැර හැරුනෙ ඇයි කියලා. අපිට සභාවට පාඩුවකුත් සිද්ධ වෙලා තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මේව වැඩ කරාට කමක් නැහැ. සරසවි හන්දියේ ගොඩනැගිල්ලෙ වහල බිමට වැටෙන්න ලගයි. ඒවත් බලන්න.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

වැඩ අධිකාරී මහතා ඒක බලල ඇස්තමේන්තුවක් දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

සභාපතිතුමනි සරසවි හංදියේ ගොඩනැගිල්ලෙ එහා පැත්ත හැරිල. මම එදා පෙන්නුව. ඒක ඉක්මන්ට හදන්න ඕනෙ. නැත්තම් පැත්තක් ගැලවිල යාවි.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කථා කරමින්,**

සභාපතිතුමනි පැරණි සතොස ගොඩනැගිල්ලෙ තාම ජලය ලැබුනෙ නැහැ. කඩ විකුනල අවුරුදු 2 ½ ක් 3 ක් විතර වෙනවා.

**තීරණය**

☛ **බස් නැවතුම්පොල කඩ කාමර නැවත තක්සේරු කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:12** ‘ ලෝක ළමා දිනය සැමරීම 2013 ‘ මැයෙන් සංවර්ධන සහකාර මහත්මිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2013 ලෝක ළමා දිනය සැමරීමේ උත්සවය පැවැත්වීමට අදහස් කර ඇති බවත් ඒ සඳහා වන ඇස්තමේන්තුව රු. 1024500.00 ක් බවත් ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☛ **ලෝක ළමා දිනය සැමරීමේ උත්සවය සඳහා වන රු. 1024500.00 ක ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:13** ‘ පළාත් පාලන මිල ගණන් 2013- 2 වන භාගය ‘ මැයෙන් පාළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2013 – 2 වන භාගයේ දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව විසින් නියම කරන ලද මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.

**තීරණය**

☛ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:14** ‘ බැංකු ගාස්තු ගිණුම්ගත කිරීම- පොදු ගිණුම ‘ මැයෙන් පොත් තබන නිලධාරිණිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ජංගම ගිණුමේ පොදු ගිණුමට අදාල ගාස්තු වශයෙන් අම්බලන්ගොඩ මහජන බැංකුව රු. 351.40 ක් අයකර ඇති බවත් එය අනුමත කරන ලෙසත් ඉල්ලා තිබුණි.

**තිරණය**

☛ **බැංකු ගාස්තු ගිණුම්ගත කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:15** ' බැංකු අයිරා පොලිය ගිණුම් ගත කිරීම ' මැයෙන් පොත් තබන නිලධාරිණිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

බැංකු අයිරා පොලිය වශයෙන් රු. 419.70 ක් අයකර ඇති බවත් එය අනුමත කරන ලෙසත් ඉල්ලා තිබුණි.

**තිරණය**

☛ **බැංකු අයිරා පොලිය ගිණුම් ගත කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:16** ' එක්වන් වාරික මුදල් ගෙවීම ' මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

විගණන පරීක්ෂණයට පැමිණි නිලධාරීන් විසින් එක්වන් මුදල් සමාන වාරික 6 කට වඩා වැඩි වාර ගණනකින් ගෙවීමට අවසර ලබා නොදිය යුතු බවත් ඒ සඳහා 2010- 12- 27 දින දපපා/පපාකො/2010 /01 දරණ චක්‍රලේඛය සභාවට යොමු කර ඒ සඳහා සභා අනුමැතියක් ලබා ගන්නා ලෙසත් ඉල්ලීම් කර තිබුණි.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්ල**

සභාව විසින් අදාල පාර්ශවයක් එක්ක ගිවිසුම් ගත වෙලා තියෙනව නම් යම් වාරික ගණනකින් සම්පූර්ණ කරනවයි කියල එයාට හයකින් ගෙවන්න කියන්න බලයක් නෑ. මේකෙ චක්‍රලේඛනයේ තියෙනව 2011-01-01 දින ඉඳලයි මේක ක්‍රියාත්මක වෙන්නෙ කියලා.

**තිරණය**

☛ **මෙම කරුණ පිළිබඳව සලකා බැලූ සභාව 2011 ජනවාරි 01 දින සිට දපපා/පපාකො/2010/01 චක්‍රලේඛය පරිදි කටයුතු කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.**

**12:17** ' අයවැය සම්පාදනය - 2014 ' මැයෙන් පොත් තබන නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛන 3 අනුව පළාත් පාලන ආයතන කළමනාකරණ වැඩිදියුණු කිරීමේ චක්‍රලේඛන මගින් මූල්‍ය කළමනාකරණය යටතේ අයවැය සම්පාදනය කල යුතු බව දන්වා ඇති බවත් කොට්ඨාශවල මන්ත්‍රීවරුන් ජුනි 30 දිනට පෙර යෝජනා ඉදිරිපත් කල යුතු බවත් දන්වා තිබුණි.

**තිරණය**

☛ **කොට්ඨාශ මට්ටමින් කමිටු පවත්වා තීන්දු ගැනීමට සභාව තිරණය කරන ලදී.**

**12:18** ‘ ආබාධිත සහිත තැනැත්තන්ගේ සැගවුනු රිද්ම ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කිරීම ‘ මැයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ආබාධිත සහිත තැනැත්තන්ගේ සැගවුනු රිද්ම ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ආබාධිත සහිත තැනැත්තන්ගේ සැගවුනු රිද්ම ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:19** ‘ කොඩි කණු 20 ක් නොමිලේ ලබා ගැනීම ‘ මැයෙන් කුලරත්න විද්‍යාලය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

කොඩි කණු 20 ක් නොමිලේ ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **කුලරත්න විද්‍යාලය සඳහා කොඩි කණු 20 ක් නොමිලේ ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:20** ‘ අම්බලන්ගොඩ නගර සභා ගෘහස්ථ ක්‍රීඩාංගණයේ පිහිටි ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත බදු දීම ‘ මැයෙන් ආදායම් පරිපාලක මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

ගාල්ල දිස්ත්‍රික්කයේ අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ පිහිටි බලයලත් මිනින්දෝරු කපිල නයිදුවාවඩු මහතා විසින් මැන සාදන ලද පිඹුරු අංක 2905 දරණ කැබල්ලෙ ප්‍රමාණය හෙක්ටයාර් 0.0606 කු වූ ගෘහස්ථ ක්‍රීඩාංගණය පිහිටි ඉඩම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ලබා දීම සඳහා 2006 වසරේ දේපල වටිනාකම රු. 3600000.00 ක් ලෙස තක්සේරු කර වාර්තා කරන බවත් ඉහත අරමුණට හැර වෙනත් අරමුණක් සඳහා යොදා ගැනීම සුදුසු නොවන බවත් දන්වා තිබුණි.

නගර සභාවේ ආදායම් පරිපාලක මහහා විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව අනුව මෙම දේපල බදු දීම සඳහා මාසික බදු කුලිය රු. 2500.00 ක් ලෙස තක්සේරු කර ඇති බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **ආදායම් පරිපාලක මහතා විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

✪ වෙනත් කරුණු

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

සභාපතිතුමනි අපි ත්‍රීවිල් කමිටුවෙන් දුන්නනෙ නතර කිරීම පිළිබඳ අවසර පත් මුදල් අය කරල. ඒ මුදල් බැඳපු අයට අසාධාරණයක් වෙනව සභාපතිතුමා සහමර අය ස්ටිකර් නොගෙන නවත්තනවා. ඊතට නීතිමය තත්වයක් කරන්න වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

මේක අපි මාස ගානක් කතා කරා. මේකෙ තත්වය බලල ඒ අවශ්‍ය කාරණාව ඉටු කරල දෙන්න. ලබන සතිය ඇතුලතම මේක කරල දාන්න. සභාපතිතුමනි මේක මේ නිලධාරීන් කරන්නෙ නැත්නම් ඔබතුමා ඒ ගැන තීරණයක් ගන්න.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මේ අවුරුද්දට බලපත්‍ර අරගෙන තියෙන්නෙ කී දෙනාද?

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**

සභාපතිතුමනි අපි ත්‍රීවිල් කමිටව කියල එකක් නමට විතරක් තියෙන්න ඕන්නෑ. අම්බලන්ගොඩ නගර සභාවට ත්‍රීවිල් කමිටුවක් අවශ්‍ය නෑ. මම යෝජනාවක් කරනව ත්‍රීවිල් ප්‍රශ්නය අම්බලන්ගොඩ පොලීසිය විසඳ ගනීවි. ඒ නිසා මම ඔබ තුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා නගර සභාවෙ ත්‍රීවිල් කමටුව විසුරුවා හරින්න කියලා. බස් නැවතුම්පොල ඉදිරිපිට තියෙන අපේ ඉඩම ලබා ගන්න. ඒකෙන් මේ සභාවට විශාල ආදායමක් අහිමි වෙලා තියෙනවා.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

ත්‍රීවිල් සම්බන්ධයෙන් අපි නීති හදල ගොඩනගාගෙන ඇවිල්ල තියෙන්නෙ. නීතිය අනුගත කිරීමේ වගකීම අප සතුයි. ත්‍රිරෝද කමිටුවයි නගර සභාවයි හැමදාම පවතිනවා. මේකෙ ඉන්නවද නැද්ද කියන එක තමන් තීරණය කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂමී හේමන්තා ද සිල්වා මෙනවිය කථා කරමින්,**

සභාපතිතුමනි බලපත්‍ර ගත්ත 42 ට ප්‍රමුඛතාවක් දි යුතුයි.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

අනිවාර්යෙන් දිය යුතුයි. ආදායම් පරිපාලක ලවා නොගත්ත අය සියලු දෙනාටම නීතිය ක්‍රියාත්මක කරන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**

සභාපතිතුමනි බස් ස්ටෑන්ඩ් එක ඉස්සරහ කී දෙනයිද බලන්න අරගෙන තියෙන්නෙ. එතන අය තුන් හතර දෙනෙකුට වඩා අරගෙන නැහැ. එතන ආදායමක් අපි නැති කරන් තියෙන්නෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මමත් එකග වෙනවා අපේ උප සභාපතිතුමා සමග. මොකද අපි වසර දෙක හමාරක් මේ කමිටුවේ ඉඳගෙන ගමේ දියුණුවට කථා කරේ. අපිට පෞද්ගලිකව හානි සිදු කරගෙන තමයි මේ කටයුත්තට සහභාගි වුනේ. මේ ස්ටිකර් ගත්ත

අයට යම් සාධාරණයක් වෙන විදියට කටයුතු කරන්න කියල ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම ඔරලෝසු කණුව ඉදිරිපිට සිටින අය මේව අරගෙන නැහැ. යම් නීතියක් තියෙනව නම් ඒක හරියට ක්‍රියාත්මක කරන්න ඕනෙ. ඒ නිසා මේ සභාවෙ ගෞරවය ආරක්ෂා වෙන විදියට මන්ත්‍රිවරුන්ගේ ගෞරවය ආරක්ෂා වෙන විදියට කටයුතු කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

**සභාවේ ඝෝෂාකාරී තත්වයක් ඇති විය.**

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

ආදායම් පරිපාලක මහතා ත්‍රිරෝද බලපත්‍ර ලබාගෙන නැති අය බලල උසාවි දාන්න. නඩු දාපු අය පිලිබඳ වාර්තාවක් සභාවට දෙන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මට දැනගන්න ඕනෙ අම්බලන්ගොඩ මේ නගරය ගැන අපි හිතමු රෙදි කඩයක් ගැන. මේ රෙදි කඩේ ඉස්සරහ පොඩි කොටසක රු 1000/- ක 2000/- ක මුදලකට දීල වෙළඳාම් කරන්න හැකියාවක් තියෙනවද කියන එක දැනගන්න කැමතියි. මොකද අම්බලන්ගොඩ නගරෙ අලුත් පාරෙ සියලුම වෙළඳ ස්ථාන වල තමන්ට අයිති පොඩි කොටස අඩි 5 X 5 කොටසත් රු. 1000/- කට 1500/- කට බද්දට දීල කඩ හිමියා මුදල් ලබා ගන්නවා. අම්බලන්ගොඩ නගරයේ රථවාහන අපහසුතා ඇති වෙන්නෙ සභාපතිතුමනි මේ නිසා. මට දැනගන්න ඕනෙ අපි රෙදි කඩ හිමියෙකුට බලපත්‍රය දීල තියෙනව නම් ඒ අය වෙනත් කෙනෙකුට නැවත බදු දීමක් කරහම ඇයි නඩු මාර්ගෙට යන්න බැරි කියලා.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

මම දැක්කා වෙසක් කාඩ් දාගෙන හිටියා එඩ්වින් එක ඉස්සරහ. ඇයි ඒව ගැන බැලුවෙ නැත්තෙ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ඇහුවම කියන්නෙ බලපත්‍රයක් දීලයි කියලා. මම දැඩි අප්‍රසාදය ප්‍රකාශ කරනවා මේ සම්බන්ධව සභාපතිතුමනි. එක්කො කඩ හිමියට නඩු දාන්න ඕනෙ ව්‍යාපාරය ඉස්සරහ මෙහෙම වෙළඳාමක් කරනව කියලා. මෙහෙම රු. 100 ට 200  ට බලපත්‍රයක් දෙනවයි කියන්නෙ ඒ මනුස්සය අම්බලන්ගොඩ ටවුන් එකේ කොතන හරි රැඳෙනව. ඒ නිසා මම ඉල්ලා සිටින්නේ ඉතා ඉක්මනින් මේක නවත්තන්න කියලා.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

අවහිරතා තියෙන සියලු දෙනා අයින් කරන්න. ඒවගේම ධර්මාශෝක විද්‍යාලය ලග ඉඳලා බස් ස්ටෑන්ඩ් එක ලගට යන පදික වේදිකාවෙ ඔලුවෙ වදින හරියෙන් බෝඩ් එල්ලල තියෙනවා. මේකෙ අතුරු නීතියක් තියෙනව නේද ? නැත්තම් ඒව ඇතුල් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ඕකන්ද පුස්තකාලෙ පිට වටෙත් සීව්ලිම ගැහුවනම් හොඳයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි අපට වසරක් පුරා බදු ගෙවනව වෙළෙන්දො. නමුත් අවුරුදු කාලෙට විතරක් කරන වෙළඳාම් තියෙනවා. උදාහරණයක් විදියට හට්ටි. ඒ අය ඇවිල්ල දවස් දෙක තුනක් ඇතුලත වෙළඳාම කරගෙන යනවා. රුපියල් දෙසිය ගානක්

වගේ තමයි බලපත්‍රය වෙන්නෙ. ඒවගේමයි පලතුරු වෙළඳාමත්. මේක වහාම නතර කරන්න ඕනෙ. මේක අපේ ව්‍යාපාරිකයන්ට වන අසාධාරණයක්.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මේ දේ මම වෙළඳ සංගමයත් එක්කත් නිතරම සාකච්ඡා කරනවා. නගර සභාවෙ ආදායමෙන් වැඩි කොටසක් සපයන්නෙ අපේ වෙළෙන්දන්. පිට අයගෙන් ගන්න ගාස්තුව වැඩි කරන්න. රු. 3000/- ක් විතර කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,**

සභාපතිතුමනි අතුරු මාර්ග දෙපස කාණු සකස් කිරීම කියල ඉල්ලීමක් කරල තියෙනවා. ජනත් චන්ද්‍රසිරි මහත්මය ඉන්න නිවසට යන පාර ඒක කොන්ක්‍රීට් කරල තියෙන්නෙ.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

ඒක අපට පවරපු පාරක් නෙමෙයි. අපට කරල දෙන්න පුලුවන්. අදාල පැවරීම කරන්න ඕනෙ.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,**

ඒවගේම සභාපතිතුමනි කෙරමිණියෙ ළිඳ. මහින්ද ප්‍රනාන්දු මහත්මයල හදල භාරදීපු ළිඳ. එතන කැලෑ වෙලා. එතන සුද්ද කරන්නයි කියල මම ඉල්ලා සිටිනවා. ඒවගේම එම්. ඩබ්. නිරංජලා දිල්රුක්ෂි කියන මහත්මිය මගේ ඡන්ද කොට්ඨාශෙ තියෙන ප්‍රශ්නයක් ඉදිරිපත් කරල තියෙනවා. පරිසර හානිය පිළිබඳව කියලා. මේක දිගින් දිගටම මේ සභාවෙ කතා වෙච්ච ප්‍රශ්නයක්. මේ සම්බන්ධව අපට සභාවක් විදියට මැදිහත් වෙන්න පුලුවන් කෙසේද කියන එක මම දැනගන්න කැමතියි.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

මධ්‍යම පරිසර අධිකාරියෙන් කියපු විදියට මෙතන කාරණා තුනක් තියෙනවා. ඒ තුල මේකෙ ගැටලුවක් තියෙනවා.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

සෞඛ්‍ය බලධාරීන් විසින් නියම කරන ලද ක්‍රමවේදයන් අනුගමනය කරල තියෙනව නම් නගර සභාවට ඊට වඩා දෙයක් කරන්න බැහැ. මෙතෙන්දි නේවාසික බලපත්‍රයක් තියෙන්නෙ. එයා වෙළඳ බලපත්‍රයක් සඳහා ඉල්ලල තියෙනවා. ගිහිපු නිලධාරියා මේ දෙක මැද්දෙ ප්‍රශ්නයකට තමයි ඇවිල්ල තියෙන්නෙ. අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ පොල්වත්ත පාර ගත්තම අඩි 100 පමණ දෙපැත්තට වානිජ්‍ය කටයුතු සඳහා වෙන් කෙරෙනවා. ඒ නිසා ඕක බලපත්‍රය දීමේ ගැටලුවක් නෑ. ගැටලුව තියෙන්නෙ වානිජ්‍ය අරමුණක් තියෙන තැනකදි අඩි 20 හෝ 15 ක පාර තියෙන්න ඕනෙ කියල තියෙනවා. නගරයේ අඩි 10 ට අටට වානිජ්‍ය ව්‍යාපාර අනුමත කරල තියෙනවා. ඒ කරුණ මත ඒක අනුමත නොකර සිටීම වැරදියි. සෞඛ්‍ය පැත්තෙන් කල යුතු දේවල් කරල තියෙනව නම් ගොඩනැගිලි අනුමත කිරීමේ පැත්තෙන් අපි අපේ යුතුකම ඉෂ්ඨ කරන්න ඕනෙ. මේ දෙන්නගේ තියෙන්නෙ වෙන ප්‍රශ්නයක්. ඒකයි ඔතන වෙලා තියෙන්නෙ.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

කමිටුවක් පත් කරහම විනිවිද භාවයක් එනවනේ.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

අපි මේ සම්බන්ධයෙන් මොන තිරනේ ගත්තත් මේ අය සෑහීමකට පත් වෙන්නෙ නෑ. අපි තීන්දුවක් කරමු මේ සම්බන්ධයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක තුමා, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමිය, පරිසර නිලධාරී, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක තුමා සහ නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරියෙකුයි, කාර්මික නිලධාරීයි එක්ව ගොස් පරීක්ෂණ වාර්තාවක් සභාවට ලබා දෙන්න කියල.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂමී හේමන්තා ද සිල්වා මෙනවිය කථා කරමින්,</u>**

සභාපතිතුමනි එඬේරමුල්ල පාර මොකක් හරි කරන්න. අපි ඇවිල්ලත් අවුරුදු දෙකක් වෙනවා. ඒකට නගර සභාවෙ සේවය කරන අයට වුවමනාවක් නැද්ද.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

එඬේරමුල්ල පාරෙ 44 වගන්තියෙ නියෝගය තාම ලැබිල නෑ. ඒ නියෝගය දෙන්නෙ ප්‍රාදේශීය ලේකම්තුමිය. ලබන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන්න එඬේරමුල්ල පාරෙ 44 වගන්තිය ලබා නොදීම හේතුවෙන් කරුණු දක්වන්න කියල.

**ප. ව. 01.15 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

ඩී. වී. සුනිල්,
ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප්,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

**2013 – 06 – 24 දින,**
**අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.**